ස යු රෙ න්

# එතෙර

එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.
ISSN 1391 5145
2022 මාර්තු



ඡායාරූපය අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී.

අවුකන පිළිම වහන්සේ.

# පොදු ජන මෙහෙවරම ජීවිතය කරගත්

# මහා ධන සිටුවරයා



**ලංකාවේ නොයෙක් හන්දිවල ඉදිකර ඇති පිළිරූ අතරින් වසර 104 ක් පුරා අඛණ්ඩව වාර්ෂිකව සැමරුම් උළෙල පවත්වා ඇත්නම් ඒ සොයිසා මහතා ගේ පිළිරුව අභියස පැවති සැමරුමයි. ඒ තරමටම ජනතාව ඔහුට කෙලහිගුණ දක්වන්නට තරම් කාරුණික වී ඇත.**

**මෑත ඉතිහාසය තුළ ලංකාවේ මහා ධන කුවේරයින් අති විශාල වශයෙන් ඇති වී නැති වී ඇත. ඔවුන් අතරින් සමාජයට සේවය කළ නොකළ පිරිස් ඇත. සමහරු යම් ප්‍රමාන වලින් සමාජ මෙහෙවර ඉටුකළ පිරිස් ද සිටිති.**

ඒ අතරින් වැඩිම සමාජ මෙහෙවරක් සිදු කළ ධනපතියා මෙන්ම ධානපතියා ද වන්නේ වරුසහෙන්නැදිගේ චාල්ස් හෙන්රි ද සොයිසාය. වර්තමානයේ කොළඹ මහ රෝහල අසල පිහිටි සොයිසා වටරවුම ඉදිරිපිට ඉදිකර ඇත්තේ එතුමාගේ පිළිරුවයි.

ලංකාවේ නොයෙක් හන්දිවල ඉදිකර ඇති පිළිරූ අතරින් වසර 104 ක් පුරා අඛණ්ඩව වාර්ෂිකව සැමරුම් උළෙල පවත්වා ඇත්නම් ඒ සොයිසා මහතා ගේ පිළිරුව අභියස පැවති සැමරුමයි. ඒ තරමටම ජනතාව ඔහුට කෙලහිගුණ දක්වන්නට තරම් කාරුණික වී ඇත.

එසේ සැමරුම් ලැබීමට තරම් ඔහු රටටත් ජනතාවටත් ඕනෑවටත් වඩා සේවය කර ඇති බැවිනි. 1836 මාර්තු 03 වනදා උපත ලැබූ එතුමා ජීවත් වූයේ වසර 54 ක් තරම් කෙටි කාලයකි. එම කෙටි කාලය තුළ එතුමා අතින් සිදුවූ මෙහෙය අති මහත්ය. ශ්‍රී ලංකාවේ ඉඩම් හිමි වැවිලිකරුවෙකු මෙන්ම ව්‍යාපාරිකයෙකු ද වූ එතුමා ගේ සිහිනය වූයේ මේරටේ පීඩිත ජනයාට සේවය කිරීමයි.

ඔහු සතුව රබර් පොල් තේ කුරුඳු ආදී වැවිලි භෝග සහිත වතු පිටි ය සක් තිබුණි. ඔහුට අවශ්‍ය වූයේ සුලු පරිමාන ග්‍රාමීය ජනයාගෙන් අඩුමිලට කුරුඳු මිල දී ගන්නා ගසා කන ව්‍යාපාරිකයින්ගෙන් ග්‍රාමීය ජනයා බේරා ගැනීමටත් සුලු නිෂ්පාදකයින්ට උපකාර කිරීමටත්ය. ඒ සඳහා පළමුව කොළඹ 4 ලිපිසල ආරම්භ කරමින් කුඩා පරිමාන දුප්පත් ග්‍රාමීය කුරුඳු නිෂ්පාදකයින් නගා සිටුවීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කළේය.

අද මෙන් එකල බැංකු පහසුකම් සාමාන්‍ය ජනයාට ලබා ගැනීමේ පහසුව නොතිබුණි. අද ද බැංකු වලින් උපරිම සේවය ලබා ගන්නේ මහා පරිමාණ ව්‍යාපාරිකයින්ය. කිසිඳු අධ්‍යාපනයක් සමාජ අවබෝධයක් නොතිබුණ එකදාස් අටසිය ගනන් වල ජනතාවගේ ජීවන රටාව කෙබඳුදැයි සිතා ගත හැකිය. එකල එවැනි ජනයාගේ කුරුඳු නිෂ්පාදන වැඩිමිලට ලබා ගැනීමටත් ඔවුන් සඳහා පහසුකම් ලබා දීමටත් සොයිසා මහතා ලිපි සල ආරම්භ කළේය.



De Soysa statue at De Soysa circus

ඒ ඔස්සේ දකුණු පළාතේ කුරුඳු වගාව මහා පරිමානයෙන් ව්‍යාප්ත විය. පොලී සහිත හා පොලී රහිත ණය ද ආධාර උපකාරද ඔහු කළේය. පුද්ගලික වශයෙන් බොහෝ ජනයාට ඔහුගෙන් උපකාර ලැබුණි.

මේ යුගය ලංකාව බ්‍රිතාන්‍ය පාලනයට යටත්ව තිබූ අවදියයි. එකල බ්‍රිතාන්‍ය මහ රැජින වූයේ වික්ටෝරියා මහ රැජිණයි. ඇය ලංකා වාසීන්ගේ අතිමහත් ගෞරවාදරයට භාජනය වූ රැජිනක් විය. ඇගේ පුත් එඩින්බරෝ ආදිපාද ඇල්ප්‍රඩ් අර්නස් ඇල්බට් කුමාරයාගේ ලංකා ගමනය සිදුවූයේ මෙම කාලයේය.

ඔහුගේ පැමිණීමේදී ලංකාවට ඉමහත් ගෞරවයක් ඇතිවන ආකාරයෙනුත් කුමාරයාගේ ගෞරවය සතුට ඇති වන ආකාරයෙනුත් ඔහුගේ පැමිණීමේ පිළිගැනීමේ හා සත්කාර සමමාන පුද කිරීම පහසුකම් සැලසීම උත්සවය සංවිධානය කිරීම යන සියලු කටයුතු සහිත එම භාරදූර වගකීම ලංකා රජය මගින් පවරනු ලැබුවේ චාල්ස් සොයිසාට සහ ඔහුගේ බාප්පාටය.

03 වැනි පිටුවට...



02 වැනි පිටුවෙන්...

# පොදු ජන මෙහෙවරම ජීවිතය කරගත්...

## මහා ධන සිටුවරයා



මෙය රුපියල් ලක්ෂ ගණනක් වැය වන රාජකීය උත්සවයක් වන අතර සුලු හා අතපසුවීමක් සිදුවීම යනු සියැතින් බෙල්ල කපා ගැනීමක් වැනිය. එහෙත් එම අභියෝගය සොයිසලාට එතරම් ලොකු අභියෝගයක් නොවීය. එය බාර ගත්තේය. ඇල්බට් කුමාරයා ලංකාවට පැමිණියේය. උත්සවය රාජකීය ස්වරූපය ඉසිලීය. ඔහු මහත් සතුටට පත්විය. බගතලේ පිහිටි මහා බංගලාවේ එදා රාජකීය කුමාරයා වෙනුවෙන් මහත් උත්සවයක් ද පැවැතිනි. සියලු පහසුකම් සොයිසලාගෙනි.

එම රාජකීය කුමරුගේ පැමිණීම සිහිගන්වමින් අක්කර 260 ක ගොවිපලක් ඉදිවිය. ඒ සඳහා සොයිසා පවුම් දහසක් පරිත්‍යාග කළේය. එය ඇල්ප්‍රඩ් ආදර්ශ ගොවිපල ලෙස නම් කෙරුණි.

චාල්ස් සොයිසා සිය ව්‍යාපාර දියුණුවෙත්ම එයින් ලබන ආදායම් වැඩිවෙන්න වැඩිවෙන්න එය මසුරුකමින් පොට්ටනි බැන්දේ නැත. වැඩි වන මුදල් සියල්ල සමාජ යහපත සඳහා වැය කළේය.

මොරටුවේ ඇති වේල්ස් කුමාර ශාස්ත්‍රාලය සහ වේල්ස් කුමරි ශාස්ත්‍රාලය යන විද්‍යාල දෙකම පිහිටුවන ලද්දේ සොයිසාගේ ධනය හා භූමි පරිත්‍යාගයෙනි. අද වන විට ලංකාවේ කීර්තිමත් පාසල් දෙකක් වන මෙය ලක්ෂ සංඛ්‍යාත දූදරුවන් පිරිසකගේ නුවණැස පාදා රටට ජාතියට ඉතා සේවයක් කළ හා කරන යහපත් පුරවැසියන් රැසකගේ ශාස්ත්‍ර ඥානය ප්‍රගුණ කළ ස්ථානයයි. මෙම ස්ථානයෙන් සිප් සතර හදාරා රටට වැඩ දායක පුරවැසි පරපුරක් සෙසු සමාජයට එක්කාසු වන්නාහ. හැම විටම එම ගෞරවය සොයිසාට හිමි වනු ඇත.

කොළඹ පැරණි ඇස් රෝහල අසල පිහිටි සොයිසා මාතෘ නිවාසය සම්පූර්ණයෙන්ම ඔහුගේ ධන පරිත්‍යාගයකි. මෙරට දුප්පත් කාන්තාවන්ට සිය නිවෙස් වලදී දරුවන් බිහිකිරීමට අවශ්‍ය පහසුකම් නොමැති කමින් සිදුවන අනතුරු විපත් ආදිය ගැන සිතා එතුමා එම මාතෘ රෝහල ඉදිකරනු ලැබුවේ එතුමා ගේ ධනය වැය කරමිනි. අද මෙරට ඇති නැති කොයි කාටතේ මහත් පිහිටක් වන අතර මිල කළ නොහැකි තරම් වටිනා බිම් ප්‍රමාණයකි.

මෙරට විසූ ධන සිටුවරයෙකු වූ චාල්ස් සොයිසා තම වත්කම තමාගේම සුබ විහරණය වෙනුවෙන් යොදා ගත් අයෙකු නොවේ. තම පරිභෝජනය මෙන් දහස් ගුණයක් අනුන් වෙනුවෙන් පරිත්‍යාග කළ අයෙකි. එපමණක් ද නොව ඔහුගේ පරිත්‍යාගයේ වටිනාකම වන්නේ එදා සිට අද දක්වා නොව අනාගතයේ තවත් ශත වර්ෂ ගණනාවක් එය පොදු ජනයා ගේම හිත සුව පිණිස හේතු වන බැවිනි.

අවුරුදු 60 කට වඩා අඩු කාලයක් ජීවත් වූ එතුමා අතින් සිදුවූ සමාජ මෙහෙවර අද වැනි සමාජයකට නම් සිතීමට තරම් අපහසු කාර්යක් වීමම ඔහුගේ මෙහෙවරට තවත් වටිනා කමක් එක් කිරීමකි.

**මෙරට විසූ ධන සිටුවරයෙකු වූ චාල්ස් සොයිසා තම වත්කම තමාගේම සුබ විහරණය වෙනුවෙන් යොදා ගත් අයෙකු නොවේ. තම පරිභෝජනය මෙන් දහස් ගුණයක් අනුන් වෙනුවෙන් පරිත්‍යාග කළ අයෙකි. එපමණක් ද නොව ඔහුගේ පරිත්‍යාගයේ වටිනාකම වන්නේ එදා සිට අද දක්වා නොව අනාගතයේ තවත් ශත වර්ෂ ගණනාවක් එය පොදු ජනයා ගේම හිත සුව පිණිස හේතු වන බැවිනි.**





# රුසියානු යුක්‍රේන යුධ ගැටුම



# තුන්වන ලෝක යුද්ධයට අත වැනීමක්ද?

**දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝකය බල කඳවුරු දෙකකට වෙන් විය. ඒ අමෙරිකාව ප්‍රමුඛ ප්‍රජාතන්ත්‍රවාදී ධනපති රටවල් හා රුසියාව ප්‍රමුඛ සමාජවාදී නැඹුරුවට හුරුවූ රටවල් යන දෙපාර්ශ්වය බලවතුන් දෙදෙනා වූයේ ඇමරිකාව සහ රුසියාවයි. 80 දශකයේ දී මේ තත්ත්වය වෙනස් විය. ඒ රුසියාවේ සමූහාණ්ඩු ක්‍රමවේදය විනාශ වී සමූහාණ්ඩු රටවල් වෙන්ව ගොස් තනි තනි රටවල් බවට පත්වීම හේතුවෙනි. මේ නිසා රුසියාව හුදකලා වූ අතර ඇමරිකාව තනි ලෝක බලවතා බවට පත්විය. යුරෝපය ප්‍රමුඛ ධනපති රටවල් ඇමරිකාවට පක්ෂව ලෝකයම පාලනය කරන මට්ටමට පැමිණියේය.**

යුක්‍රේනය යනු රුසියානු සමූහාණ්ඩුව යටතේ පැවති පසුව කැඩී වෙන්වී ඇති රටකි. එකම භූමියකින් වෙන් වී යනු යාබද රාජ්‍යයකි. යුක්‍රේනය දිනාගැනීම සඳහා ඇමරිකාව නිතර නිතර සිය දේශපාලන උපාය උපක්‍රම භාවිතා කළේය. යුක්‍රේනයේ වර්තමාන ජනාධිපති වික්ටර් යුශේන්කෝ ඇමරිකාව ප්‍රමුඛ බටහිර කඳවුර සමග හාදකම් පැවැත්වීම වේගවත් කළේය. ඔහු යුරෝපා සංගමයේ සාමාජිකතත්වය මෙන්ම නේටෝ සංවිධානයේ සාමාජිකත්වයද අපේක්ෂාවෙන් සිටියේය. අසල්වැසි රුසියාව අමතක කර යුරෝපය සමග බැදීම වැඩිවීම රුසියාව



රුස්සන්නේ නැත. ඇමරිකාව යුක්‍රේනය ගිල ගැනීමට දීර්ගකාලයක සිට දැක්වූ වෑයම සාර්ථක වීමට ආසන්න විය.

රුසියානු ජනාධිපති විදැමිලර් පුටින් යනු රුසියානු ජනයා ගේ හද දිනාගත් 2035 දක්වා බලය තහවුරු කරගත් ප්‍රබල නායකයෙකි. ඔහු දැඩි හා ඍජු තීරණ ගන්නා නායකයෙකි. රුසියානු සමූහාණ්ඩුව බිඳවැටීමෙන් පසු ආර්ථික වශයෙන් බොහෝ දුෂ්කර අඩියකට ඇද වැටුනු රුසියාව නැවත නගා සිට වූ ජනාධිපති ඔහුය. රුසියාව ආර්ථික වශයෙන් ඇද වැටී තිබුණද සමූහාණ්ඩු සමයේ ඔවුන් සතුව පැවති යුධ ශක්තිය න්‍යාෂ්ටික බලය එලෙසම පැවතීය.

අද වන විට ඔවුන් ආර්ථික වශයෙන් ද යුධමය අතින්ද ඉතා බලසම්පන්න අවදියක සිටිති. දීර්ග කාලයක සිට ඇමරිකානු බලපෑම දෙස උකුසු ඇස යොමා සිටි පුටින් යුක්‍රේනයේ ක්‍රියා පිළිවෙත හොඳින් අධ්‍යයනය කළේය. යුක්‍රේනය ඇමරිකානු හිතවාදියෙකු වීම රුසියාවට ප්‍රබල තර්ජනයකි. එසේ යුක්‍රේනය අසල්වැසි රුසියාව අතහැර දුර සිටින ඇමරිකාව සරණ යෑමට දක්වන ක්‍රියා පිළිවෙත අසල්වැසියා මගහැර යෑමක් බව පැහැදිලිය.

මෙහිදී පුටින් ඉක්මන් විය. ඇමරිකානු මැදිහත්වීම පුටින් ගේ ප්‍රහාරය ඉක්මන් කිරීමට හේතු විය. යුක්‍රේන ජනාධිපති වරයාද සිටියේ ඇමරිකාව හා යුරෝපය කෙරෙහි අධිතක්සේරුවකිනි.

රුසියාව යනු යුරෝපයට තේල් හා ගෑස් සැපයුමෙන් 40% ක් සැපයන සැපයුම්කරුය. යුරෝපය රුසියාවට එරෙහිව යුක්‍රේනයට උපකාර කිරීම යනු යුරෝපයද බරපතල ගැටලු රැසකට අවතීර්ණ වීමකි.

**යුක්‍රේනය යනු රුසියානු සමූහාණ්ඩුව යටතේ පැවති පසුව කැඩී වෙන්වී ඇති රටකි. එකම භූමියකින් වෙන් වී යන යාබද රාජ්‍යයකි. යුක්‍රේනය දිනාගැනීම සඳහා ඇමරිකාව නිතර නිතර සිය දේශපාලන උපාය උපක්‍රම භාවිතා කළේය. යුක්‍රේනයේ වර්තමාන ජනාධිපති වික්ටර් යුශේන්කෝ ඇමරිකාව ප්‍රමුඛ බටහිර කඳවුර සමග හාදකම් පැවැත්වීම වේගවත් කළේය. ඔහු යුරෝපා සංගමයේ සාමාජිකතත්වය මෙන්ම නේටෝ සංවිධානයේ සාමාජිකත්වයද අපේක්ෂාවෙන් සිටියේය. අසල්වැසි රුසියාව අමතක කර යුරෝපය සමග බැදීම වැඩිවීම රුසියාවට රුස්සන්නේ නැත. ඇමරිකාව යුක්‍රේනය ගිල ගැනීමට දීර්ගකාලයක සිට දැක්වූ වෑයම සාර්ථක වීමට ආසන්න විය.**

5 වෙනි පිටුවට...

ස යු රෙ න් එතෙර
එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය

# රුසියානු යුක්‍රේන යුධ ගැටුම ...

4 වෙනි පිටුවෙන්...

තෙල් ගෑස් වලට අමතරව රුසියානු භාණ්ඩ රැසක් යුරෝපය තුළ අලෙවි වනු ඇත. යුධ ශක්තිය අතින් ගත් කළ ඇමරිකාව හා සම මට්ටමේ රුසියානු යුධ ශක්තියද බලවත්ය. ලොව විශාලම ආයුධ ගබඩාව පිහිටා ඇත්තේද රුසියාව තුළය. රුසියාවට චීනයේ පූර්ණ ආශිර්වාදය ඇත. වර්තමාන ලෝකයේ සම මට්ටමේ සිටින බලවතුන් තිදෙනා වන්නේ ඇමරිකාව රුසියාව හා චීනයයි. මෙම තුන්ගොල්ල තුළම න්‍යෂ්ටික අවි ගොඩ ගසා ඇත. මෙම රටවල් තුනම ආයුධ හා ආර්ථික වශයෙන්ද පොහොසත්ය. යුක්‍රේනය ඇමරිකාව දෙසට හැරීම වැලැක්වීම සඳහා චීනය ද විශාල වශයෙන් උත්සාහ දැරීය.

කෙසේ නමුත් යුක්‍රේනයට රුසියාව පහර දීම හේතුවෙන් යුරෝපා රටවල් ඇතුලු ඇමරිකාව කම්පනයට පත්විය. එහෙත් ඔවුන්ට මෙම යුද්ධය සඳහා සක්‍රීයව දායක වීමට හැකියාවක් නැත. එම රටවල් සක්‍රීයව දායක වීම යනු ලෝක විනාශයට අතවැනීමකි. තවද ඔවුන් ආර්ථික වශයෙන් දැඩි පීඩනයකට ලක්වීමකි.

යුරෝපය රුසියාවට එරෙහිව සක්‍රීයව යුධ ප්‍රකාශ නොකළත් අනියම් මාර්ග ඔස්සේ රුසියාව අකර්මන්‍ය කිරීමට උත්සාහ දරමින් සිටියි.

සම්බාධක පැනවීම මුලින්ම සිදුකළේ ඒ අනුවය. රුසියාවට භාණ්ඩ යැවීම රුසියාව තුළ ඩොලර් භාවිතය අතහැරීම රුසියානු මුදල් ඒකකය වන රූබලය යුරෝපා රටවල් පිළිනොගැනීම ජගත් සංවිධාන හරහා සම්බාධක පැනවීම ලෝක පාපන්දු ඇතුලු ක්‍රීඩා වලට සහභාගිවීම රුසියාවට තහනම් කිරීම ආදී සම්බාධක රැසක් බටහිර රටවල් විසින් රුසියාවට එරෙහිව දියත් කළේය.

ඔන් ලයින් ක්‍රමවේද ඔස්සේ රුසියානු බැංකු සමග කරන මූල්‍ය ගනුදෙනු යුරෝපීය බැංකු අත්හිටුවන ලදී. මේ හරහා රුසියාවට බලපෑම් කළහැක. තවත් සමහර රටවල් යුක්‍රේනයට අවි ආයුධ මුදල් ආදියෙන් උදව් උපකාර කිරීමට ඉදිරිපත්



වී ඇත.

මෙම සිදුවීම් සිදුවෙද්දී රුසියානු ජනාධිපති ව්ලැදිමිලර් පුටින් ප්‍රකාශ කලේ අපට එරෙහිව කටයුතු කරන සැමට ඉතිහාසයේ අත් නොවිඳ ඇති දරුණු ප්‍රති ප්‍රහාරවලට මුහුණ දීමට සිදුවන බවයි. යන

**යුක්‍රේනයට රුසියාව පහර දීම හේතුවෙන් යුරෝපා රටවල් ඇතුලු ඇමරිකාව කම්පනයට පත්විය. එහෙත් ඔවුන්ට මෙම යුද්ධය සඳහා සක්‍රීයව දායක වීමට හැකියාවක් නැත. එම රටවල් සක්‍රීයව දායක වීම යනු ලෝක විනාශයට අතවැනීමකි. තවද ඔවුන් ආර්ථික වශයෙන් දැඩි පීඩනයකට ලක්වීමකි.**



තර්ජනාත්මක ප්‍රකාශයයි. පුටින් කිසි විටක කට මැත දොඩවන හෝ පුරසාරම් දොඩවන නායකයෙකු නොවේ. ඔහු අන් රටවල් බිය ගැන්වීමට හෝ මුට්ටිය දමා බැලීමට මීට පෙර වහසි බස් දොඩා නැත. කිසිවකු අපේක්ෂා නොකල අවස්ථාවක සිය හමුදා සේනාංක යුක්‍රේනයට ගොඩ බැස්වීය.

යුක්‍රේනය හෝ රුසියාව යන දෙරටින් එකක් පසු බැස යන තුරු මෙම යුද්ධය නොනවතිනු ඇත. රුසියාව කිසි විටකත් මෙම යුද්ධයෙන් පසු බසින්නේ නැත. යුක්‍රේන ජනාධිපතිට රටින් පැන යෑමට අවස්ථාව යුරෝපය විසින් සකස් කර දීමට සූදානම් විය. එහෙත් ඔහු



ප්‍රකාශ කළේ ජනතාව සමග මියෙන තුරා සටනෙහි නිරතවන බවය. එයත් එක් අතකින් අභීත ප්‍රකාශනයකි. එයින් ඔහු අදහස් කරන්නේ යටත් නොවන බවයි.

විශාල විනාශයකින් පසු යුක්‍රේනයට සිදු වන්නේ රුසියාවේ යටත් රාජ්‍යයක් බවට පත්වීමටය. මෙහිදී පුටින් යුක්‍රෙනය සිය රටට ඈදා ගනීවිද එසේත් නැත්නම් තමාට අවනත පාලකයෙකු අතට යුක්‍රේනයේ බලය අත්පත් කර දේවිද යන්න තාමත් නිශ්චිත නැත. ඒ පිළිබඳව ඔහු තම මතය ප්‍රකාශ කර නැත. මෙම ක්‍රම දෙකෙන් කුමකින් හෝ අවසානයේ සිදුවන්නේ එයින් එකකි. රුසියාව සතුව අතිවිශාල ස්වභාවික සම්පත් රැසක් ඇත. ඒවායේ නිෂ්පාදන ඇතුලු එම ස්වාභාවික සම්පත් වලට වැඩි ඉල්ලුම ඇත්තේ යුරෝපය තුළය. රුසියාව තරහ කරගත්තද යුරෝපයට එම සම්පත් අත්‍යාවශ්‍යයය. විශේෂයෙන් තෙල් මිලදී ගත් කැනඩාව ඇතුලු රටවල් තෙල් මිල දීගැනීම සඳහා දැන් මැදපෙරදිග වෙළඳ පල කරා ගමන් කරමින් සිටී. තෙල් සඳහා එසේ කලද ඔවුන්ට අවශ්‍ය සියලුම භාණ්ඩ හෝ තෙල් ප්‍රමානය වෙනත් රටවලින් ලබාගැනීමට හැකියාවක් නැත.

රුසියාව තුළ ස්ථාපිත කොට ආරක්ෂිත උපාය මාර්ග හා රට තුළ තරකර ඇති යුධ ශක්තිය නිසා රුසියාව තුළට පැමිණ පහරදීම වෙනත් රටකට පහසු කටයුත්තක් නොවේ. එසේ පහර දීමට නම් ඇමරිකාව වැනි රටක් සෘජුව හා සක්‍රියව මේ සඳහා ඉදිරිපත් විය යුතුය. එහෙත් ඇමරිකාව එවැන්නකට ඉදිරිපත් වේ යැයි සිතිය නොහැක.

ඇමරිකාව විශේෂයෙන් එවැන්නකට පැමිණෙන්නේ එම රට තුළ ඇති යුධ ශක්තිය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමෙන් පසුවය. ඉරාකය වැනි රටවලට පහර දුන්නේද එවැනි පූර්ණ පරීක්ෂාවකින් පසුව එම රටවල් යුධමය අතින් ඉතාම දුර්වල බව තේරුම් ගැනීමෙන් පසුවය. එහෙත් රුසියාව යනු දුර්වල රටක් නොවේ. බොහෝ විට ඇමරිකාව දක්ෂ වෙනත් රටවල අභ්‍යන්තරය තුළ හා අනිත් අතින් රාජ්‍යයන් අතර ගැටුම් ඇති කිරීමටය. රුසියානු යුක්‍රේන් ගැටුමටද ඇමරිකාව විසින් කළේ ගින්නට පිදුරු දැමීමය. විශේෂයෙන් බටහිර විසින් අවුලවන ලද ගින්නකි. අද යුක්‍රේනය තනිවී හමාරය. ඒ ගැන යුක්‍රේන ජනාධිපති වරයා කියා සිටියේ නේටෝව අප තනිකලා යනුවෙනි. එය ඇත්තකි.

රුසියාව හා යුක්‍රේනය අතර පමණක් ගැටුම සිදුවුවහොත් එය ක්‍රමයෙන් නිවී යනු ඇත. මේ ගැටුම තුළට වෙනත් බළල් අත් හරහා තවත් පිරිස් කොස් ඇට බාවන්නට කටයුතු කළහොත් එය ලෝක යුද්ධයකට මග පාදන්නක් වනු ඇත.

# හෙළදිව ආභරණ

**වර්තමාන ලෝකයේ විලාසිතා යනු අරුම පුදුම දෙයක් නොවේ. යන යන තැන අසන අසන තැන මගුල් ගෙදර මළ ගෙදර උපන්දින සාදය ප්‍රිය සම්භාෂණ මේ ආදී කී නොකී හැම තැනම නන් විසිතුරු විලාසිතාය. එපමණක් ද නොව මග තොට වැඩපල නිවෙස කියා බේදයක් ද නොමැතිව විලාසිතා දක්නට ඇත**

ඒ අතරින් ආභරණ පැළඳීම විශේෂය. ඇඳුමට ගැලපෙන මාලය මුද්ද වළල්ල හවඩිය මේ සියල්ල නන් විසිතුරු ලෙසින් නෙත් සිත් ඇදගන්නා මන බන්ධනීය දැකුම්කලු දර්ශනම වන්නාහ.


ලෝක ඉතිහාසයත් ලක්බිම ඉතිහාසයත් හදාරද්දී පෙනී යන්නේ මානව වර්ගයාගේ ආරම්භයේ සිටම විලාසිතාව පමණක් නොව ආභරණ පැළඳීමක් සිදුවී ඇත. කෙසේ නමුත් යුරෝපයට පෙර ආසියානු කලාපයේ ආභරණ භාවිතය සිදුවූ බවට ඇති සාක්ෂි ගැන අප පුදුම නොවිය යුතුය. හේතුව මානව වර්ගයාගේ ඉතිහාසය ආරම්භ වන්නේ ආසියාවෙනි.

ආසියානු කලාපයේ මූලාරම්භයේ සිටම ලංකාව හෙවත් හෙළබිම ද මනුෂය වාසයේ මුල් යුගයටම උරුමකම් කියයි.

ශ්‍රී ලංකාවේ මූලාශ්‍ර පදනම් කරන හෙළබිම ආභරණ ගැන කතා කළොත් මහා වංශය තුළින් ඒ පිළිබඳව සාක්ෂි ඕනෑ තරම් සොයා ගත හැක. එමෙන්ම මුල් කාලීන ග්‍රන්ථ ඇසුරෙන්ද පුරා විද්‍යා සාක්ෂි ඇසුරෙන්ද ජීවමාන තොරතුරු හමු වෙයි.

මීට වසර 28,000 කට එහා ඉතිහාසයක් ඇති බටදොඹ ලෙන හිඳ අදින් වසර 13000 ට එහා ඉතිහාසයක් ඇති කිතුල්ගල බෙලිලෙනෙහි ද කරන ලද පුරාවිද්‍යා කැනීම වලදී ආභරණ සඳහා යොදාගත් සත්ව ඇටකටු කිරිදි ඇට බෙලි කටු ආදිය සොයාගෙන ඇත.

ඈත අතීතයේ සිටම ලංකාව මැණික් සඳහා ප්‍රසිද්ධ වූ දිවයිනකි. ක්‍රි.පූ. 6 වන ශත වර්ෂයේ



දුටුගැමුණු රජතුමා



බුදුරජාණන් වහන්සේ ලක්බිමට වැඩම කරන්නේ මැණික් පුටුවක් සම්බන්ධව සිදුවන අරගලයක් හේතුවෙනි. එයින් අදහස් වන්නේ මැණික් භාවිතයෙන් අලංකාර කරන ලද මෙවලම් මෙරට වැසියන් භාවිතා කළ බවයි. පුටුව මැණික් ඔබ්බවා අලංකාරණය කළේ නම් පළඳනා සඳහා මැණික් භාවිතා නොකළැයි සිතිය නොහැකිය.

මහා වංශයේ දැක්වෙන පරිදි විජය කුමරු ලංකාවට ගොඩබැස යක්ෂ නායකයා මරා දමා ඔහුගේ ආභරණ පැලඳූ බව කියයි. ඒ සිංහල ශිෂ්ටාචාරය ආරම්භ වීමටත් ප්‍රථම මෙරට ආභරණ පැළඳී බවට හොඳම සාක්ෂියකි.

කිරිඉබ්බන් කටුව ඓතිහාසික සුසාන භූමියේ සිදු කළ පුරාවිද්‍යා කැනීම් වලදී කානීලියන්, ඔනික්ස්, ටොරාකොටා ආදියෙන්ද රත්‍රං වීදුරු ආදියෙන් තනන ලද පබලු වර්ග හමුවී ඇත. මේ අතර ඔනික්ස් හා කානීලියන් බහුලව දක්නට ඇත්තේ ඉන්දියාවේය. ඒ අනුව මොවුන් ආභරණ සඳහා විදේශවලින්ද අමුද්‍රව්‍ය ආනයනය කරන්නට ඇතැයි සිතිය හැක.

මීට අමතරව අනුරාධපුරය ආදී ප්‍රදේශවලින් සොයා ගෙන ඇති ආභරණ කොටස් වලට අනුව ප්‍රාග් ඓතිහාසික යුගයට වඩා පූර්ව ඓතිහාසික යුගයේ ආභරණ පැළඳීම හා ඒ සම්බන්ධ තාක්ෂණයන් ආභරණ නිෂ්පාදනයත් වැඩිදියුණු වී ඇති බවයි.

ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ දී පමණ අශෝක රජතුමා විසින් දෙවන පෑ තිස් රජුට එවන ලද තුටු පඬුරු අතර මෝලි, පාංමංග, වටංස යන ආභරණ තුනක් ගැන සඳහන් වේ. මේවා මොනවාගේද යන්න හරිහැටි නොදන්නා නමුත් ආභරණ බව මූලාශ්‍රවලින් පැහැදිලිය.



කිරිඉබ්බන් කටුව ඓතිහාසික සුසාන භූමියේ සිදු කළ පුරාවිද්‍යා කැනීම් වලදී කානීලියන්, ඔනික්ස්, ටොරාකොටා ආදියෙන්ද රත්‍රං වීදුරු ආදියෙන් තනන ලද පබලු වර්ග හමුවී ඇත.

**ලෝක ඉතිහාසයත් ලක්බිම ඉතිහාසයත් හදාරද්දී පෙනී යන්නේ මානව වර්ගයාගේ ආරම්භයේ සිටම විලාසිතාව පමණක් නොව ආභරණ පැළඳීමක් සිදුවී ඇත. කෙසේ නමුත් යුරෝපයට පෙර ආසියානු කලාපයේ ආභරණ භාවිතය සිදුවූ බවට ඇති සාක්ෂි ගැන අප පුදුම විය නොවිය යුතුය. හේතුව මානව වර්ගයාගේ ඉතිහාසය ආරම්භ වන්නේ ආසියාවෙනි.**

ක්‍රි.පූ. පළමු සියවසේදී පමණ රුවන්වැලි මහා සෑ රඳුන් ධාතු නිදානෝත්සවයට දුටුගැමුණු මහරජු ස්වර්ණාභරණින් සැරසී තවත් ආභරණ පැළැදි කාන්තාවන් පිරිවරාගෙන මෙම උත්සවයට සහභාගි වූ බව මහා වංශයේ සඳහන් කර ඇත. තවද රුවන්වැලි මහා සෑ රඳුන් අභියස ඇති දුටුගැමුණු රජු ගේ යැයි සැලකෙන පිළිමයේ ද රජතුමා ආභරණින් සැරසී සිටිනු දැකිය හැක.

බෝධි සත්ව රූප සඳහා රජවරු ආභරණ පැලැන්දූ බවක් මහා වංශයේ කීප තැනකම දක්නට ලැබෙයි. මහා වංශයට අමතරව ශිලා ලේඛන තුළ ද ආභරණ පිළිබඳව සටහන් තබා ඇති ස්ථාන ඇත.

දහවන සියවසේ පුලියන්කුලම පුවරු ලිපිය දොළොස්වන සියවසේ පළමු පරාක්‍රම බාහු රජුගේ දෙවනගල ශිලා ලිපිය තුළද ආභරණ ගැන බොහෝ තොරතුරු ඇතුළත් කර ඇත. මේ අතර නිශ්ශංකමල්ල රජුගේ ශිලා ලිපි රැසකම රන් රිදී මුතු මැණික් දී දුගී ජනයාට සෙත සැදූ බව සඳහන් වේ.

මීට අමතරව පැරණි සාහිත්‍ය ග්‍රන්ථ රැසකම ආභරණ පිළිබඳව සඳහන් වෙයි. එම ග්‍රන්ථ කතුවරුන්ට තම නිර්මාණ වල එලෙස සඳහන් කිරීමට ඉඩ හසර ලැබෙන්නේ දැනුමෙන් පත පොතින් අත් දැකීමෙන් දක්නට ලැබීමෙන් කරනු ලබන සත්‍ය හෝ උප කල්පන මත පිහිටාගනය.

**පින් පියවුරු තන් -**
**ලෙව් දළ හර නිලගේ කල**

**ඉසිලූ පියවුරු බර -**
**පියුම් බර ඉසිලී**

මේ "සසදාවත" කාව්‍ය ග්‍රන්ථයේ එන පැදියකි.

මීට අමතරව "කව් සිළුමිණ" කාව්‍ය ග්‍රන්ථයේද "සද්ධර්ම රත්නාවලිය", "පූජාවලිය", "උම්මග්ග ජාතකය" ආදී ග්‍රන්ථ වලද ආභරණ පැළැඳීම පිළිබඳව දැක්වෙයි.

තවද සංදේශ කාව්‍යවලද පැළැදි ආභරණ පිළිබඳව කියවෙයි.

**"නොමද වොරැදි සඳ බල අබරණ පැළඳ"** එසේ කියන්නේ ගිරා සංදේශයයි. පරවි සංදේශයේ **"වරමිණි කිරුළු සහ සිව්සැට වරණ දැරූ"** යනුවෙන් ද දැක්වේ. **"කැටිකළ රිවි කිරණ පැටිකළ පැළැදි අබරණ"** යනුවෙන් හංස සංදේශයේ කරුවා කියයි.

**"උණුනොව බරණ සිවු සැට වොටුණු ද පැලඳ" "උදුලේ දොහෝ රන් පටවන් නළල් තෙලේ" "සවනේ රැ දුනු රසඳුල තෝඩු ගණ රනේ" "කනා මිණි වළලු තැගි රැස් මල් කැනැති" "වෙරලු මිණි කැලුම් පතරින් මෙවුල තුරු" "වදනා සුරන් කිරුළ'ග රැවන කැළුවෙනා"** මෙලෙස දක්වා ඇත්තේ සැළලිහිණි සංදේශයේ

7 වෙනි පිටුවට..

6 වෙනි පිටුවෙන්..

# හෙළදිව ආභරණ ...

ආභරණ පිළිබඳ කියවෙන ස්ථානය. ඉපැරණි ග්‍රන්ථයක් වූ පැරැකුම්බා සිරිතෙහි 6 වන පැරකුම්බාවන් වර්ණනා කරන 126 වන කාව්‍යයේ

**ඉඳුනිල් රුවනින් දිළි**
**රන් කිරුළින් දෙසවන්**
**කොඩොලින් සුලබේ.**

**උරමල් යුවළින්**
**ගෙලරන් ලකරින් බුජමින්**
**වලයෙන් සංසාබේ**

**මුතුදැල් මෙවුලින්**
**දගමින් පතරින්**
**පදපංකජරන් සලඹේ**

මෙසියල් බරණින් පැරැකුම් රජ දැන් ලකසන් රජු මෙන් වැජබේ.

මෙම රජුගේ ආභරණ පිළිබඳව එලෙස දක්වා ඇත. මීට අමතරව " මන්දාරම් පුවත" ඓතිහාසික තොරතුරු ඇතුළත් පැරැණි කාව්‍ය ග්‍රන්ථයේ රජවරුන්ගේ ආභරණ තැන්පත්කර ඇති ස්ථාන පිළිබඳව ද දක්වා ඇත.

මේ තුළින් පැහැදිලිව පෙනෙන දෙයක් නම් ඈත ඉතිහාසයේ සිට මෙලක වාසීන් ආභරණ පිළිබඳව උනන්දුවක් දක්වා ඇති බවත් ඒවා තම සෞභාග්‍ය අලංකාරය ජන ආකර්ශනය දිනා ගැනීම උදෙසා පැළඳ ඇති බවත්ය.

ඉපැරණි චිත්‍ර මූර්ති ආදිය පරීක්ෂා කිරීමේදී ද එම චිත්‍රවලද මූර්තිවලින්ද දක්වා ඇත්තේ ආභරණ පැළඳගත් කාන්තා රූප, පිරිමි රූප, දේව රූප, යක්ෂ භූ. රූප සඳහාද ආභරණ එක්කොට එම රූප කෙරෙහි ජනතා අවධානය යොමු කිරීමට මූර්ති ශිල්පීන් සමත් වී ඇත.

**ශ්‍රී ලංකාවේ ඉපැරණීම දේව රූප නාග රූප බෝසත් රූප මුරගල් ආදියෙහි කැටයම්කර ඇති රූප මේ සියල්ලකම එම රූප අලංකරණය සඳහා ආභරණ ඒවාට එක්කොට ඇත. එයින් පැහැදිලි වන්නේ අප රටේ අනාදිමත් කාලයක සිට ආභරණ පැළඳීම සිදුවූ බවකි.**

සාහිත්‍යකරුවාද මූර්ති ශිල්පියාද චිත්‍ර ශිල්පියා ද ඇතුලු කලාකරුවන් තම නිර්මාණ සඳහා ආභරණ මෙවලමක් බවට පත්කරගෙන ඇත.

ශ්‍රී ලංකාවේ ඉපැරණීම දේව රූප නාග රූප බෝසත් රූප මුරගල් ආදියෙහි කැටයම්කර ඇති රූප මේ සියල්ලකම එම රූප අලංකරණය සඳහා ආභරණ ඒවාට එක්කොට ඇත. එයින් පැහැදිලි වන්නේ අප රටේ අනාදිමත් කාලයක සිට ආභරණ පැළඳීම සිදුවූ බවකි.

ආභරණ පැළඳීමට නම් ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය පමණක් නොව ඒවා නිර්මාණය සඳහා ඒ ඒ දැනුම ඇති ශිල්පීන් ද සිටිය යුතුය. ආභරණ සඳහා රන් රිදී මුතු මැණික් ආදී අමු ද්‍රව්‍ය තිබිය යුතුය. රත්‍රං වැනි ලෝහ ලංකාවේ හමු නොවෙයි. එසේ නම් ඒවා විදෙස් රට වලින් ගෙන ආ යුතුය. එනම් ආනයන කටයුතු ද ඈත ඉතිහාසයේ සිට තිබිය යුතුය. ලෝහ කර්මාන්තය ද තිබිය යුතුය. ඒ පිළිබඳ දැනුම ඇති ශිල්පීන් ද සිටිය යුතුය.

ක්‍රි. පූ. පළමු 6 වන සියවසේ දී පවා ලංකාවේ ආභරණ පිළිබඳ පුරා වස්තු හමුවී ඇත. එතරම් ඈත අතීතයක සිට ලංකාවට ආභරණ පිළිබඳ ඉතිහාසයක් ඇත. කෙමෙන් කෙමෙන් තාක්ෂණය දියුණු වීමත් හුදකලා වූ ලෝකය විශ්ව ගම්මානයක් බවට පත්ව තාක්ෂණය අමු ද්‍රව්‍ය ශිල්පීන් යහමින් සිටින අද වන් යුගයක ආභරණ හා විලාසිතා සඳහා මිනිස් සිත ඇදී යාම අරුමයක් නොවේ.


# Ceylon Shipping Lines Ltd.

## Printing Department



CSL Printing is a fully fledged design printing department equipped with latest technology including Computer offset printing from concept to finished product, with the capacity and capability to undertake all types of commercial printing for local & overseas customers.

**Ceylon Shipping Lines Ltd.,**
**Printing Department,**
**No. 758/3, Dr. Danister De Silva Mawatha,**
**Colombo 09.**
**Tel: 011 - 2683237 Fax: 011 - 2683238**
**E- mail: cslpri@sltnet.lk**

**Head Office:**
**Ceylon Shipping Lines Ltd.,**
**No. 450, D.R. Wijewardana Mawatha,**
**Colombo 10.**
**Tel: 011 - 2689500 - 8**




衛生防護中心 Centre for Health Protection

更多防疫資訊
For more information on fighting the virus:
www.coronavirus.gov.hk

衛生防護中心Facebook專頁
Centre for Health Protection Facebook Fanpage
fb.com/CentreforHealthProtection

衛生署 Department of Health

二零二零年三月製作 Produced in March 2020



# ලගදීම රට නවතී ද?

**ගතවූ වසර ආරම්භයත් සමග ශ්‍රී ලංකාව බරපතල ආර්ථික අර්බුධයකට ඇද වැටුනි. දැන් රට යන්නේ ඉතාම අවධානම් අවදියකය. ලදරම් වාහනයක් ගල් බොරළු සහිත අමාරු කන්දක් අදින වග පෙනේ. තාමත් වාහනයේ රියැදුරා අවධානම දකිනවා විනා එහි ගොඩවී සිටින පිරිස් එය තාම තේරුම් ගෙන නැත.**

**අපි වැටී ඇති බරපතලම තත්වය විදේශ මුදල් හිඟතාවයයි. ජාත්‍යන්තර ගනුදෙනු සඳහා ඩොලර් අවශ්‍ය වෙයි. ඒ සඳහා රටට ඩොලර් හිඟයක් පවතී.**



අද ලෝකය දුවන්නේ බල ශක්තියෙනි. ඒ සඳහා අපටද බලශක්තිය අවශ්‍ය වෙයි. අපට අප රටේ බලශක්තිය නැත. එය පිට රටින් ගෙන ආ යුතුය. ඒ සඳහා ඩොලර් අවශ්‍යයය.

ඉන්ධන සඳහා මසකට ඩොලර් මිලියන 250-300 ක් අතර ප්‍රමාණයක් වැය වෙයි. මාසිකව එපමණ ඩොලර් ප්‍රමාණයක් අපට ලැබෙන ආදායම් මාර්ග මේ වන විට ඇන හිට ඇත. ප්‍රධාන වශයෙන් සංචාරක ව්‍යාපාරයෙන් හා විදේශගත ශ්‍රමික ජනයාගෙන් රටට ලැබෙන මුදල් සීග්‍රලෙස පහත වැටීම එයට හේතුවයි.






1977 විවෘත ආර්ථිකයත් සමග සියල්ල පිටරටින් ගෙන ඒමේ ආර්ථික න්‍යායකට අපි අනුගත විය. ඒ අනුව ජනතාවද ඕනෑම දෙයක් ක්ෂනිකව කඩේට ගොස් ගෙන ඒමට පුරුදු වූහ. එයට කෙතරම් අපි වශී වූයේද යත්, ඒ වන විට දේශීය වශයෙන් නිෂ්පාදනය වූ කර්මාන්ත පවා වසා දමන තත්ත්වයට පත්වී විදේශ විනිමය උපයා ගන්නා මාර්ග පමණක් නොව විදේශ විනිමය සීමා කරගත හැකි මාර්ග ගැනද අපි අවධානය යොමු කළේ නැත.

නව ලිබරල් වාදය යනුවෙන් කතාකරන මෙම ආර්ථික රටාව තුළ ජනතාව අත රුපියල් ඇතත් භාණ්ඩ නැත. මේ වන විට ජනතාව පොහොසත් වී රජය දුප්පත් වී ඇත.

ඉන්දියාව බංගලාදේශය වැනි රටවල ඇත්තේ මෙයට වෙනස් ක්‍රමයකි. ජනයාට සපයන පහසුකම් අඩුකොට දේශීය සම්පත් රජය තුළ සිරකරගෙන සිටීම ඔවුන්ගේ න්‍යායයි.

දුප්පත් ආණ්ඩුව මේ වන විට අසරණය. අසරණයා මැඩලීම සමාජයේ සිරිතය. වෘත්තීය සමිති අද කරන්නේ රජය මැඩලීමයි. රජය අද පැති කීපයකින් අසරණ වී ඇත.

පළමුවැන්න දුප්පත්කමයි. ජනතාවගේ ජීවන රටාව යථා තත්වයට පත් කර ගැනීමට අවශ්‍ය මූලික පහසුකම් සැපයීමට නොහැකිව රෝගාතුරවූ පියෙකුගේ භූමිකාවට පත්ව ඇත. ජනතාවට පහසුකම් සපුරා දීමට නොහැකිවීම හේතුවෙන් නිරන්තරව ජනතාව පීඩනයට හසු වී සිටිති.

නිරන්තර විවේචනයට භාජනය වී සිටිති. තෙල් නෑ, පෝර නෑ, විදුලිය නෑ, බඩු නෑ, බඩු ගණං ජීවත් වෙන්න විදියක් නෑ යන මේ කී නොකී අදෝනා එහි ප්‍රතිඵලය.

අනිත් පැත්තෙන් වසංගත හේතුවෙන් අනපේක්ෂිත වියදම් රැසකට ගොදුරු වී සිටියි. පළමුව ජනයා ගේ නිරෝගී භාවය රැකිය යුතුය.

තවත් පැත්තකින් දීර්ග කාලයක් පුරා අප ණයට කෑමේ උච්ච අවස්ථාවට පත්ව සිටිමු. ඒ කාපුවාගේ ණය ගෙවීම දැන් ආරම්භ වී තිබේ. ඩොලර් හිඟය එක පැත්තකින් එද්දී 2026 වසර වනවිට ලංකාව ඩොලර් බිලියන 6.5 ක ණයක් ගෙවා අවසන් කළ යුතුය. ඒ ණයට කෑමේ ප්‍රතිඵලය.

මේ සියල්ල මෙසේ තිබිය දී වෘත්තීය සමිති හා විරුද්ධ දේශපාලන පක්ෂ විසින් නව අර්බුධ නිර්මාණය කරමින් ඉදිරියට දමමින් බොරදියේ මාලු බාති. පියා අසරණ වූ විට හැඩි දැඩි චාරයක් නැති පුත්තු පියාගේ සීරි මාංශ උරා බොන අවස්ථා අපි දැක ඇත්තෙමු. රජය විරුද්ධ පක්ෂය වෘත්තීය සමිති හා ජනමාධ්‍ය යනු රටේ ප්‍රබලම ගාමක බලවේගයයි. ඔවුන් කළ යුතුව ඇත්තේ ඇති වී ඇති ප්‍රශ්නයට සාමූහික විසඳුමක් සෙවීමය. නමුත් ඔවුන් සියලු දෙනාම කරන්නේ තම තමාගේ බලය තහවුරු කරගැනීමේ බල ව්‍යාපෘතිය.

ඉදිරියේදී රජයට එල්ලවන පීඩනය මෙයට වඩා බරපතල වනු ඇත. එය වක්‍රව කැරකැවී ගොස් ආපසු එන්නේ ජනතාව අතරටමය. එය දැනෙන්න කාලයක් යන නිසා ක්ෂනිකව ඇතිවන රැලි වලින් ජනයාටද පොඩි ගැමම්ක් ඇති වෙයි. හරියටම පසුගිය කාලයේ අපි ණයට කන කොටද මෙම ගැම්ම තිබුණි. හැම තැනම වාහන, යෝධ සංවර්ධනය, රයිස්, කොත්තු, කේඑෆ්සී, පීසා හට්, සංගීතය, රූපලාවණ්‍ය, විලාසිතා ලංකාව එකම සුර පුරයකි. දැන් ඒ සුරපුරය පහතට ගරා වැටෙමින් පවතී.

මෙවැනි ආර්ථික න්‍යායක් තුළ ජීවත් වන පිරිස් අප ගම්මාන වලද සිටිති. ආදායමට වඩා වැඩියෙන් වියදම් කරමින් ළමුන් බිරිඳ සැමියා ඉල්ලන ඉල්ලන දේ දෙමින් විනෝද චාරිකා උත්සව කොත්තු රයිස් නයිට් ක්ලබ් මේ ආදී සරුව පිත්තල ලෝක වල ජීවත් වී ණය දරාගත නොහැකිව තම දෙමාපියන්ගෙන් පවා උරුම වූ දේපොළ විකුණාගන කන දරුවන් සිටිති. අපේ රටටද දැන් සිදුවී ඇත්තේ එයය.

10 වෙනි පිටුවට...

09 වෙනි පිටුවෙන්...

# ලගදීම රට නවතී ද?...

**මෙපමණ කාලයක් මේරට පාලනය කළ සියලු දෙනා ඇතුලුව සමස්ත ජනයා අඩු වැඩි වශයෙන් මෙයට වග කිව යුතුය. අඩුම තරමේ මේ මහ පොළවේ ඉබේට වැවෙන කුරුදු ගම්මිරිස් පොල් පුවක් කරාබු නැටි සාදික්කා වැනි අපනයන භෝගවත් නිසි ආකාරයටකට රට තුළ වවා තිබුණා නම් අද වන විට ලංකාවට මෙම අර්බුධය ඇති වන්නේ නැත.**






එවැනි දේකටවත් ජනතාව හෝ රජය පසු ගිය වසර 70 ට අධික කාලය තුළ අවධානයක් යොමු කර නැති බව පෙනේ.

අපි අපේ සීනි සමාගම විනාශයට ඇද දමා අද සීනි ගෙන්වාගත නොහැකිව හූල්ලති. ඔරුවල වානේ සංස්ථාව විනාශ කළ අපි අද යකඩ නැතුව යකඩ ගිනි ගනං කියමින් දෙස් දොවාල් තබති. අපිට අයිතිව තිබුණු අපේම කඩදාසි ව්‍යාපාරය විනාශ කරගත් අපි අද වන විට උග්‍ර කඩදාසි හිඟයකට මුහුණ පා සිටිති. අපේ සිමෙන්ති විනාශ කරගත් අපි අද සිමෙන්ති ගොඩබා ගත නොහැකිව වද විදිති. අපි සතුව තිබූ දේශීය කිරි නිෂ්පාදනය පැත්තකට විසිකර තලුමර මර රට කිරි අගය කරමින් ඒවා බීමට පුරුදු විය. දැන් අද වන විට ඩොලර් නැතුව කිරිපිටි වරායේ සිරවී ඇත. ලක්මවගේ දූ දරුවන් කිරිපිටි නැතිව හඬා වැටෙමින් පෝලිම්වල සිටිමින් විද්‍යුත් මාධ්‍ය වෙත 'වොයිස් කට්' ලබා දෙනු දක්නට අසන්නට ලැබේ. හැබැයි ඒ එකම 'වොයිස් කට්' කාරයෙක් වත් ඒ එකම මාධ්‍ය කාරයෙක් වත් අපි මේ 'ඇස්සට දත නියවන' බව කියන්නේ නැත.

කෙසේ නමුත් මේ වන විට ශ්‍රී ලංකා මහබැංකුව සතුව ඇත්තේ විදේශ විනිමය මිලියන 2000 ටත් අඩු ප්‍රමාණයකි. මෙය සාමාන්‍යයෙන් මාස තුනකට තෙල් ගෙන ආ හැකි මුදලකි. මේ වන විට ඉන්දියාවෙන් තෙල් ණයට ගැනීමට ගිවිසුම් අත්සන් තබා ඇත. ඒ නිසා මාස කීපයකට තෙල් ලැබෙයි. එහෙත් ණය වාරික ගෙවීමෙන් අත්‍යාවශ්‍ය බෙහෙත් හේත් ආදිය පිටරටින් ගෙන ආ යුතුය. මේ සඳහා රට තුළ දැනට ඇති විදේශ මුදල් සංචිත ප්‍රමාණය ප්‍රමාණවත් නැත.

අපිට ප්‍රධාන වශයෙන් ඩොලර් ලැබුණු මාර්ග දෙකම මේ වන විට වැසී අවසන්ය. අපිට ඩොලර් ලැබුණු යුගයේ තව තවත් ඩොලර් ලැබෙන මාර්ග වැඩි දියුණු නොකර ගැනීමේ ශාපය අද වන විට සියලු දෙනාම අත් විදිමින් සිටිති. ඇත එපිට දර පොල් කොළ ඇති ගැමියන් පවා ගෑස් වලට පුරුදු වූහ. ප්‍රධාන මාර්ග ඉදිරිපිට ජනයාට පවා ලීස් කරපු වාහනයක් අත්‍යාවශ්‍ය විය. ඇළ දොළ ගංගා වැව් පොකුණු ළිං යහමින් ඇත්තන් පවා ගෙවීමේ පදනමට වොෂින් මැෂිං ගත්හ. කොස් දෙල් අල බතල අරහං විය. රට කෑම රට බීම පැණි බීම දෛනික ආහාර පාන විය.






වැඩි වැටුප්, අඩු සුදුකම්, අඩු වැඩ, වැඩි වරප්‍රසාද රැකියාවේ සුරක්ෂිත බව විශ්‍රාම වැටුප මේ සියල්ල සපුරන රජයේ රැකියාවකින් තොර ජීවිතයක් නැති තරමට තරුණ තරුණියන් රැකියා සඳහා යොමු කළහ.

වර්ජනය, ගර්ජනය, උද්ඝෝෂණ, ත්‍රස්තවාදය, පගාව කොමිස් දේශපාලන අත පෙවීම් පක්ෂ බේදය, මත්පැන්, මත්ද්‍රව්‍ය, උත්සව, සාද, මැතිවරණ නිරන්තරයෙන් රට තුළ අසන්නට දකින්නට අත්විදින්නට අවශ්‍ය තෝතැන්න නිර්මාණය වූහ. මේ එක දිනකින් එක පැයකින් සිදුවූවා නොවෙයි. දිනෙන් දින මාසෙන් මාසේ වර්ෂයෙන් වර්ෂය ගොඩනැගුණු අද වන විට උතුරා දෝරේ ගලන තත්ත්වයට පත්වූ දේවල්ය. ණය ගැනීම විනෝදාංශයක් කරගත් පාලකයින් ජනතාවද එයට පුරුදු කළහ. හොඳ ණයක් ගෙන එයින් හොඳ කොමිස් එකක්ද ලබාගෙන එයින් ජනතාව ද විසිතුරු දෙයක් මවා පාමින් පුරසාරං දේශපාලනයේ අග්‍රඵලය අද අපි අත් විදිමින් සිටිමු.

එදා වේල සොයාගෙන බඩ වියත රැකගන්නා තත්ත්වයට පත්වී දිය කෙළියේ යෙදෙන කකුළුවන් බවට අපි අද පත්ව සිටිමු. මෙහි ප්‍රතිඵලය ඉදිරියට අතිශ්‍ය භයානකය. බෙහෙත් උගුරක් නැතිව මැරෙන්නට සිදුවුවහොත් ඒ ගැනද අපි පුදුම විය යුතු නොවේ.

ඉතාලිය ඇමරිකාව ජපානය ජර්මනිය සිංගප්පූරුව කොරියාව ආදී රටවල් ද ඉතිහාසයේ මෙවැනි අත්දැකීම් ලබා එයින් අද ගොඩට විත් ලෝකය ජය ගෙන ඇත. එදා ඒ රටවල් ඒ අභියෝග යේදී ජනතාව එයට මුහුණ දුන්නේ ස්ව උත්සාහයෙනි. නමුත් අපේ ජනතාව තාමත් මේ අභියෝගය අවබෝධකරගෙන නොමැත. ඒ නිසා අපි තවත් මේ ආකාරයෙන්ම පහළට කඩා වැටෙන අතර රටම නැවතී ඉදිරියට යා ගත නොහැකි වූ දාට වාහනයෙන් බැස සියලු දෙනා වාහනය තල්ලු කරන තෙක් ගොඩ ඒමක් නැත. ගමනේ අමාරුකම දැනෙන්නේ තාමත් රියදුරාට මිස ඒ තුළ සිටින මගීන්ට නොවේ. එයට තවත් කෙටි කාලයක් යා යුතුව ඇත.

වාහනය නවතින තුරු ෆස්ට් ගියර් එකේ අපි යමු.



# මාධ්‍ය කලාවට සමුදුන් බන්ධුල පද්මකුමාර



මාර්තු මාසය තුළ මෙරට ප්‍රවීන මාධ්‍යවේදීන් දෙදෙනෙකු අභාවප්‍රාප්ත වුහ. ඒ බන්ධුල පද්මකුමාර හා සුනිල් මාධව ප්‍රේමතිලකයි. යොවුන් පුවත් පත් කලාවෙන් මාධ්‍ය කලාවට එක්වූ බන්ධුල පද්මකුමාර පොදු ජනයා අතර ජනප්‍රිය නමක් දිනා ගත්තේ ජාතික පුවත්පත් කලාවට එක් වූවාට පසුවය.

තරුණ තරුණියන් අතර ජනප්‍රිය වූ පුවත්පත් රැසක් එකල ආරම්භ කළ ඔහු 1994 දී "ලක්බිම" පත්‍රය ඇතුලු සුමති ප්‍රකාශන ආයතනයේ පුවත්පත් රැසක කතෘ ධූරය හෙබවීය.

මෙරට ජාතික පුවත්පත් වලට ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ අතිරේක පුවත්පතක් ආරම්භ කළ මුල්ම මාධ්‍යවේදියා ඔහුය. ඒ "ලක්බිම" පුවත්පතේ "රිද්ම" අතිරේකය හරහාය. එකල මෙරට ජනයා අතර ප්‍රචලිතව තිබූ "දිවයින" "ලංකාදීප" " දිනමිණ" ආදී පුවත්පත් අතරට ලක්බිම ජනතා ආකර්ශනය දිනා ගන්නේ "රිද්ම" අතිරේකය තුළිණි. පසුකාලීනව අනිකුත් පුවත්පත් සඳහාද අතිරේක පුවත්පතක් අත්‍යාවශ්‍ය තැනට ලක්බිම පාඨක අවධානය දිනා ගත්තේය.

එකල ඔහු ඇරඹූ " සමුදුර" පුවත්පත විශ්ව දැනුම සොයා යන්නන් අතර අතිශ්‍ය ජනප්‍රිය පුවත්පතක් බවට පත්විය.

අදමෙන් යූ ටියුබ්, ෆේස්බුක්, අන්තර් ජාල පහසුකම් නොතිබුණ කොළඹට විතරක් ඒවා සීමාවී තිබුණත් සමාජයේ ඉහළම පැලැන්තිය එම පහසුකම් ලබා ගත් යුගයේ බන්දුල "සමුදුර" මගින් එම අඩුව පිරවීය.

සතිපතා පලවන සමුදුර පුවත්පතේ අන්තර්ගතය වූයේ විශ්ව තොරතුරුය. අන්තර්ජාලය හා ජාත්‍යන්තර සගරා වල පළවූ සතියේ සුවිශේෂී ප්‍රවෘත්ති විශේෂාංග ඇසුරෙන් සමුදුර පිරී තිබුණි. තරුණ මහලු උගත් නූගත් සෑම ජනතාවක් සඳහාම එහි තිබූ ලිපි සමබරව තිබුණා පමණක් නොව සෑම ලිපියක්ම සාරවත් ලිපියක් විය. දුර්ලභ ජායාරූප එහි බොහෝ සෙයින් පළවීය. විශේෂයෙන්ම එය මිලදී ගන්නා පාඨකයා මුලු පුවත්පතම කියවන තැනට එහි අන්තර්ගතය සාරවත් විය.



නව අදහස් නව සංකල්ප ඔහු තුළින් හැමවිටම විද්‍යාමාන විය. මාධ්‍ය කරුවෙකු තුළ තිබිය යුතු විශේෂ වූ කුසලතාවක් වන එය බන්ධුල මැනවින් විද්‍යාමාන විය. බන්ධුල හැමවිටම අලුත් දෙයක් කිරීමට අලුත් විදියට සිතීමට උත්සාහ කළ මාධ්‍ය කරුවෙකි.




ලක්බිමෙන් ඉවත්වූ බන්ධුල ටික කලක් නිහඬව සිටියේය. ඔහු ඊළගට යෝධ පිම්මක් ඉදිරියට පැන්නේය. ඒ රූපවාහිනී මාධ්‍ය තුළිනි. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය එකට එක්කළ තැනකි. " ස්වර්ණවාහිනී" චැනලය තුළින් "මුල් පිටුව" ඉදිරිපත් කළේය.

දිනපතා පුවත්පත් වල සිරස්තල රූපවාහිනී මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් කිරීම ඔහුගේ වෑයම විය. ඊට පෙරද එවැනි වැඩ සටහන් විද්‍යුත් මාධ්‍ය ඔස්සේ විකාශනය වුවද ඒවා පාඨකයාට එතරම් වැදගත් වූයේ නැත. නමුත් බන්ධුල ගේ ඉදිරිපත් කිරීම පාඨකයාට වැදගත් විය. එම චැනලය තුළ වැඩිම ප්‍රේක්ෂක සංඛ්‍යාවක් නැරඹූ වැඩ සටහන එය විය. අනතුරුව අනිකුත් චැනල් තුළද පුවත්පත් සිරස්තල කියවීමට පටන් ගත්තේය. දැන් වන විට සියලුම විද්‍යුත් මාධ්‍යවලට මෙය නැතිවම බැරි අංගයක් විය. මෙය බන්ධුල පද්මකුමාරගේ නව නිර්මාණයකි.

මුද්‍රිත පුවත්පතට ටැබ්ලොයිඩ් අතිරේකයත් රූපවාහිනී මාධ්‍යයට පුවත්පත් සිරස්තලත් යන දෙකම බෝ කළ පුරුදු කළ ඇබ්බැහි කළ මාධ්‍ය වේදියා ඔහුය. ඒ අතින් බන්ධුල නව නිර්මාණාත්මක මාධ්‍ය වේදියෙකි. මාධ්‍ය වේදීන් අතර මෙවැනි පෙරළිකාර මාධ්‍ය හැඩගැස්වීමක් කළ තවත් අය ඇත්නම් ඒ අතලොස්සකි.

මෙම නව නිර්මාණාත්මක කෞශල්‍යයෙන් හෙබි මාධ්‍ය කරුවෙකු වූ බන්ධුල පද්මකුමාර ගේ නාමය තව බොහෝ කලක් මාධ්‍ය ක්ෂේත්‍රය තුල රැදී පවතිනු ඇත ඔහුට නිර්වාන සුවය ප්‍රාර්ථනා කරමි.


CEYLON SHIPPING LINES LTD
SPECIAL RATES ON COURIER PACKAGES
WE HAVE SPECIAL RATES FOR BELOW COUNTRIES
AUSTRALIA
GERMANY
CANADA
UK
USA
GEORGIA
BELGIUM
NEW ZEALAND
SPAIN
Ceylon Shipping Lines LTD
No. 450, D. R. Wijewardena
Mawatha,
Colombo 10.
Tel : 011 - 2689500 - 8
Call us now for the attractive rates,
M :- 0772672970
0773572835
0773561210
E :- csltravels@sltnet.lk



## වීදියක් නැතත් වීදියක් ගැන කියන

# කොම්පඤ්ඤ වීදිය

දිනක් රාත්‍රී මුර සංචාරයේ යෙදුන පොලිස් නිලධාරියෙකුට මළ සිරුරක් හමුවිය. ඔහු මේ පිළිබඳ අදාල රාජකාරී සිදුකර පොතේ සටහන් තැබීමට යෑමේදී මාර ප්‍රශ්නයකට මුහුණ දුන්නේය. ඒ එම මළ සිරුර තිබූ ප්‍රදේශය ලිවීමට ගොස්ය. මළ සිරුර තිබී ඇත්තේ කොම්පඤ්ඤ වීදියේය. අනතුරුව නිලධාරියා මළ සිරුර යුනියන් පෙදෙසට ඇදගෙන ගොස් දමා ඇත. එහි දමා යුනියන් පෙදෙසේ දී මළ සිරුරක් හමුවී යැයි පොලිස් පොතේ ලීවේය.

මේ විහිලු කතා කියන කොම්පඤ්ඤවීදිය ප්‍රදේශය වහල් දූපත යනුවෙන්ද හඳුන්වයි. කොළඹ ආශ්‍රිත ඉතාම ජනප්‍රිය ප්‍රදේශයකි. රාජ්‍ය ආයතන හමුදා කඳවුරු ප්‍රධාන මාර්ග රැසක් මෙම ප්‍රදේශයේ දක්නට ඇත. කොම්පඤ්ඤවීදිය යැයි නම් කළත් එහෙම වීදියක් නම් එම ප්‍රදේශයේ නැත. අද එය එකට පිහිටි බිම් කඩක් ලෙසින් තිබුණත් මීට සියවස් කීපයකට පෙර මෙම ප්‍රදේශය දූපතක් වශයෙන් තිබී ඇත. ස්ලේව් අයිලන්ඩ් නමින් එය හඳුන්වා ඇති අතර අදද සමහරු එම නම භාවිතා කරති.

මෙම ප්‍රදේශයේ කලක් ඇෆ්ගන් ජාතිකයින් බහුලව සිට ඇත. ඒ නිසා කලක් ඇෆ්ගන් ටවුම නමින්ද හඳුන්වා ඇත. තවත් කලක මැලේ ජාතිකයින් බහුලව වාසය කොට ඇත. කාපරි ජාතිකයින් බහුලව තවත් යුගයක මෙම ප්‍රදේශයේ සිටි නිසා කාපිරි ටවුම නමින්ද හඳුන්වා ඇත. බේරේ ටවුම ලෙසද සමහර ඉංග්‍රීසි හා සිංහල ලේඛනවල දක්වා තිබේ. මේ සියල්ලෙන් හඳුන්වා ඇත්තේ වර්තමාන කොම්පඤ්ඤවීදිය ප්‍රදේශයයි.

1630 වසරේදී පෘතුගීසීන් විසින් ඉන්දියාවේ ගෝව ප්‍රදේශයේ සිට මලබාර් වරාය හරහා කාපිරි ජාතික වහලූන් මෙරටට ගෙන්වා කොම්පඤ්ඤවීදියේ එදා පිහිටි දූපතේ රදවා සිට ඇත. වර්තමාන කොම්පඤ්ඤවීදිය පොලීසිය පිහිටා ඇත්තේ එම ප්‍රදේශයේය.

එකල බටහිර රටවල තිබූ විශාල වෙළඳ ව්‍යාපාරයකි වහල් වෙළදාම. සුදු ජාතිකයින් විසින් කලු ජාතිකයින් වහලූන් වශයෙන් යොදා ගැනුනු අතර වහලූන් ගේ අයිති කරුවන්ට මුදල් ගෙවා මොවුන් යම් යම් වැඩවලට යොදවා ගනිති.

18 වන සියවසේ වහලූන් ගේ කැරැල්ල සිදුවී ඇති අතර එහිදී බැරැන්ට් වැන්ඩර් ස්ටොන්ස් නමැති පිස්කල් නිලධාරියා හා ඔහුගේ බිරිඳ නිදි යහනේම කිරිච්චියකින් ඇණ මරා දමා ඇති අතර මෙහිදී අවට ගොඩනැගිලි කඩා දමා මහත් ප්‍රචණ්ඩ ක්‍රියා රැසක් සිදුවී ඇත.

මෙම කැරැල්ලෙන් පසුව අනාවරණය වී ඇත්තේ පිස්කල්වරයා ගේ නිවසේ වැඩකරන කාපිරි ජාතික වහලෙක් ඔවුන්ගේ නිදන කාමරයේ කලින්ම සැගවී සිට පිස්කල්වරයා හා බිරිද නින්දට ගිය පසු මරා දමා ඇති බවයි. මේ හේතුව නිසා එදා සිට සවසට සියලූ වහලූන් පොලිම් ගසා නම් අඩගසා ගෙන ගොස් ඇත. සැලී පෝර්ට් යනු එකල බේරේ වැවේ තිබූ තොටුපලකි.

**කොම්පඤ්ඤවීදිය ප්‍රදේශය වහල් දූපත යනුවෙන්ද හඳුන්වයි. කොළඹ ආශ්‍රිත ඉතාම ජනප්‍රිය ප්‍රදේශයකි. රාජ්‍ය ආයතන හමුදා කඳවුරු ප්‍රධාන මාර්ග රැසක් මෙම ප්‍රදේශයේ දක්නට ඇත. කොම්පඤ්ඤවීදිය යැයි නම් කළත් එහෙම වීදියක් නම් එම ප්‍රදේශයේ නැත. අද එය එකට පිහිටි බිම් කඩක් ලෙසින් තිබුණත් මීට සියවස් කීපයකට පෙර මෙම ප්‍රදේශය දූපතක් වශයෙන් තිබී ඇත.**



එදා වහල් දූපතට විහාරස්ථානය පෙනෙන අයුරු

අනතුරුව ලන්දේසි බසින් අයර් නමින් හැදින්වූ කඩතොලු සහිත දූපතකට ගෙන ගොස් එහි තිබූ ලයින් කාමර වැනි මුඩුක්කුවල මොවුන් පදිංචි කොට ඇත. ඒ නිසා එය වහල් දූපත ලෙස නම් විය. එයට වහල් දූපත යනුවෙන් නම් කළේ ඉංග්‍රීසීන් විසිනි. 1845 දී ඉංග්‍රීසින් ලංකාවේ වහල් වෙළදාම තහනම් කළ අතර පසුව ලොව බොහෝ රටවල වහල් සේවය තහනම් විය.

කෝඩිනර්ගේ වාර්තාවලට අනුව 1807 ලංකාවේ කාපිරි ජාතිකයින් 700 ක් පමණ සිටි බව කියවේ. ත්‍රිකුණාමලය මඩකලපුව පුත්තලම ආදී ප්‍රදේශවල මෙම ජාතීන් පසුව ව්‍යාප්ත වී ඇත.


කපිර් වෙල්ඩ්ට් නම් විවෘත භූමියක බ්‍රිතාන්‍ය සොල්දාදුවන් විසින් කාපිරි වෙනුවෙන් බැරැක්ක ඉදි කළ බවත් එහි එක් මායිමක් බේරේ වැවත් අනිත් මායිම කොටු බැම්ම බවත් මුලාශ්‍රවල සදහන්ය. ලන්දේසි ආණ්ඩුකාර ගොයන්ස් ගේ වාර්තාවලට අනුව ලන්දේසි යුගයේ කාපිරි 4000 ක් පමණ මෙරට සිට ඇති අතර ඔවුන් කොළඹ කොටුව ඉදිකිරීමට යෙදවූ බවත් කියවේ.

මුවෙන්චිකෝ හි සංගීතයත් චතුරංග හෙවත් ක්වෝඩ්‍රිල් නැටුමත් මෙම කාපිරින්ට අයත් සුවිශේෂී සංස්කෘතික අංගයකි.

කාපිරින් විසින් වැන්ඩර් වරයා මරා දැමීමෙන් පසු ඔහු විසූ එම නිවස හොල්මන් මන්දිරයක් වූ බව පැවසේ. එහි කිසිවෙකුට වැඩි කලක් විසීමට නොහැකි වී ඇත. පසුව ඉංග්‍රීසින් එම නිවස කෝපි ගබඩාවක් බවට පත්කර ඇතත් එය ද පසුව කඩා ඉවත් කර ඇත.

දැනට කෝසල පටුමග ලෙස හඳුන්වන ස්ථානය කපොරා මුඩුක්කුව යනුවෙන් ඊට පෙර භාවිතා කළේය. ඕලන්ද බසින් කපිර් වේල්ඩ්ට් යනු කාපිරියන් පෙරට්ටුව සඳහා කැදවූ ස්ථානයයි. වර්තමානයේ ලංකා බැංකු මූලස්ථානය පිහිටා ඇති

14 වෙනි පිටුවට...



# විනෝද සමයේ අවසන් හඬද නිහඬ විය.

මෙරට ගුවන් විදුලිය ආරම්භ වන්නේ 1940 දශකයේය. ගුවන් විදුලිය ආරම්භයේදී ගුවන් විදුලි නාට්‍ය ද ආරම්භ වූ අතර විවිධ නාට්‍ය කණ්ඩායම් ගුවන් විදුලි නාට්‍ය ග්‍රෑමපෝන් තැටි වලට හඬ කවා ගුවන් විදුලියට බාර දෙයි. මෙම කණ්ඩායම් අතර තැපැල් හා විදුලි සංදේශ නාට්‍ය කණ්ඩායම ප්‍රමුඛ කණ්ඩායමක් බවට පත්විය. ඒ අනුව හාස්‍ය රසයෙන් යුත් ගුවන් විදුලි වැඩ සටහනක් මුලින්ම ගුවන් විදුලියට ඉදිරිපත් කිරීමේ ගෞරවය හිමි වන්නේ එකී සංගමයේ සිටි ඒ. ඒ. පෙරේරා මහතාටය.

මෙකල හාස්‍යෝත්පාදක ගුවන් විදුලි නාට්‍ය ඉදිරිපත් කිරීමේ ලා ඒ. ඒ. පෙරේරා මෙන්ම දොන් බෙනඩික් ශිල්පියා ද වින්සන්ට් වීරසේකර හා හැරියට් සුරවීර නම් ප්‍රකට විය. ජෝෂප් සෙනෙවිරත්න එඩී ජයමාන්න ද තවත් ප්‍රචලිත වූ දෙදෙනෙකි. රුක්මනී දේවි හා හෙක්ටර් එදිරිසිංහ ද ඒ අතර විය. 1942 දී ජේ. විජේවීර ශිල්පියා ඉදිරිපත් කළ ඒක මේක වටින් පිටින් හාස්‍ය රසයෙන් යුත් වැඩ සටහන් ද ඉමහත් ප්‍රසිද්ධියට පත්විය.

1952 අගෝස්තු 05 එතෙක් ගුවන් විදුලි අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස කටයුතු කළ යුරෝපීය ජාතික ජෝන් එන් ලැම්ප්සන් විශ්‍රාම ගිය පසු ඇම්. ජේ. පෙරේරා මහතා එම තනතුරට පත්වීමෙන් පසු ශ්‍රී ලංකා ගුවන් විදුලියේ ඉංග්‍රීසි උෟරුව ඉවත්ව ගොස් සිංහල ස්වභාවයට පත්විය. ඔහු ගුවන් විදුලිය නව ආරකට ගත් අතර 'විහිලු තහලු' නමින් හාස්‍යෝත්පාදක වැඩ සටහනක් ගෙනගිය අතර එය ඉමහත් ජනප්‍රිය වැඩ සටහනක් බවට පත්විය.

එකල මෙම වැඩසටහනේ සම්පාදක වූයේ එච්.ඩී. විජේදාස මහතාය. ඔහු එයට ඇල්ප්‍රඩ් පෙරේරා, එච්.ටී. බස්නායක ඇනස්ලි ඩයස්, බර්ටි ගුණතිලක, සැමුවෙන් රුද්‍රිගු, ස්වර්න ශ්‍රී සරත්වීර යන අය සහභාගි කරගත් අතර පැය භාගයක වැඩ සටහනක් සඳහා දින 10-12 ක් පමණ පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව පටිගත කළ අතර එක් ශිල්පියෙකුට එක් වැඩ සටහනක් වෙනුවෙන් රු. 5.00 ක ගෙවීමක්ද කළේය. මෙම වැඩ සටහනට විශාල ජනප්‍රියත්වයක් ලැබුණු අතර හැමවිටම එයට වස්තු බීජය වූයේ සමාජයේම සිදුවන සිදුවීම් දේශපාලකයින් ගේ නොමනා ක්‍රියා ආදිය හාස්‍යයට ලක් කිරීමය.

විජේදාස මහතා ගුවන් විදුලියෙන් ඉවත් වූ පසු මෙම ශිල්පීන් අතර සිටි තාමත් ජීවතුන් අතර



සිටින ඇල්ෆ්‍රඩ් පෙරේරා විසින් ඇනස්ලි ඩයස් බර්ටි ගුණතිලක සහ සැමුවෙල් රුද්‍රිගු එකතුකර ගෙන 'විනෝද සමය' වැඩසටහන ආරම්භ කළේය.

එකල සමාජයේ උසස් යමක් කමක් තියෙන පොහොසත් ගෙදරක පමණක් ගුවන් විදුලි යන්ත්‍රයක් තිබූ අතර ඈත පිටිසර නම් තිබුනේම නැත. කලාතුරකින් නිවසක ගුවන් විදුලියේ හඬ ඇසුන නමුත් එම උපකරණය දැකීම පවා දුර්ලභ අවස්ථාවකි. විනෝද සමය අතිශ්‍ය ජනප්‍රිය වැඩ සටහනක් වූ අතර එය නොඇසූ අය පවා විනෝද සමය ගැන දැන සිටියහ. එය ඒ තරමට සමාජයට බද්ධ වූවකි.

පසුකාලීනව ගුවන් විදුලියේ කටයුතු වලින් ඇල්ෆ්‍රඩ් පෙරේරා ඉවත් වූ අතර ඇනස්ලි බර්ටි සැමුවෙල් ත්‍රිත්වය විනෝද සමය ගෙන ගියහ. මෙම ත්‍රි මූර්තිය ලංකාවේ අතිශ්‍ය ජනප්‍රිය වූ අතර හාස්‍යොත්පාදනයෙහි ලා මොවුන් තිදෙනා එකම ඒකාධිකාරී බලයක් පවත්වාගෙන යන තරමට මොවුන් ජනප්‍රියත්වය හා දක්ෂතාවය රැක ගැනීමට සමත් වූහ.

අසූව දශකයෙන් පසු ගුවන් විදුලිය හා රූපවාහිනිය සාමාන්‍ය ගෘහ මෙවලමක් බවට පත්වූවාට පසු මෙම විකට ත්‍රි මූර්ථිය ගැන නොදන්න අයෙකු නැති තරම් විය. අනතුරුව ඔවුන් ගුවන් විදුලිය තුළ පමණක් නොව රූපවාහිනිය තුළ ජනප්‍රිය චරිත බවට පත්වෙමින් මෙරට ජනයාගේ සමීපතමයන් බවට පත් වූහ. ඔවුන් වයසට පත්වීමත් ඇනස්ලි ඩයස් හා සැමුවෙල් රුද්‍රිගු මියගිය අතරම ඉතිරිව සිටියේ බර්ටි ගුණතිලක මහතා පමණි.

1924 අගෝස්තු 02 වනදා මහනුවර උපත ලැබූ දොන් සංඝතිස්ස ගුණතිලක ගේ පියා වූයේ දොන් හෙන්ද්‍රික් ගුණතිලකය. මව විල් ආරච්චිගේ මියුරියල් පෙරේරාය. උඩරට ප්‍රභූ රඳල පවුලක් වූ මෙම ගුණතිලක දරුවන් හත්දෙනෙකුගෙන් යුත් පවුලේ දෙවැනියාය.

ලේඛන කලාවට දක්ෂකම් දැක්වූ බර්ටි ගුණතිලක සිංහල භාෂාව ඇතුලු භාෂා කීපයක්ම පිළිබඳව හසල දැනුමක් ලබා තිබුණි. ඔවුනොවුන් රඟපෑ බොහෝ හාස්‍යෝත්පාදන කතා බොහෝ ප්‍රමාණයක් බර්ටි විසින් ලියා ඇත.

හොඳම ඉනාව සිනහව වුවත් සිනා නොවන අය බොහෝය. සිනා නොවන්නන් පවා හිනස්වා සතුටු සාගරයක ගිල්ල වූ මෙම මහා කලාකරුවා ශ්‍රී ලංකාව තුල කලා ක්ෂේත්‍රයේ ගොඩ නැගූ පෞරුෂය අතිමහත්ය. එය මෙරට වංශ කතාව තුළ තවත් බොහෝ කලක් පාඨක මතකයේ රැදෙනු ඇත. ඔහු සිනාසෙනවාට වඩා අන් අය සිනා ගැන්වීමට ඔහුගේ හැකියාව විය. මෙරට අති මහත් ජනාදරයට පත්වූ විනෝද සමයේ අන් අය විනෝදයට පත්කළ විනෝදකරුවන් තිදෙනාගෙන් තෙවැන්නා වශයෙන් බර්ටි ගුණතිලක යන් පසුගියදා අප අතරින් සමු ගත්තේ විනෝද සමයට අවසාන තිත තබමිනි. විනෝද සමයේ විනෝදකරුවන් ත්‍රි මූර්ථයම මේවන විට මෙලොවින් සමුගෙන අවසන්ය. ඇනස්ලි බර්ටි සැමුවෙල් තිදෙනාසේම මෙරට විනෝදාස්වාද කලාවෙහි එක් පරිච්ඡේදයක් මෙසේ අවසන් වෙයි. ඔවුන් තිදෙනාටම නිර්වාන සුවය ප්‍රාර්ථනා කරමු.

# කොම්පඤ්ඤ වීදිය....


13 වෙනි පිටුවෙන්...

චතුරශ්‍රය යාබදව මෙම ස්ථානය පිහිටා ඇත.

කෙසේ වෙතත් ලංකාවේ වහල් සේවය මුලින්ම අරඹා ඇත්තේ පෘතුගීසීන්ය. එහෙත් ඊට ප්‍රථමද කාපිරි ජාතිකයින් ලංකාවේ සිට ඇත. අටවෙනි හා 9 වෙනි සියවස්වල ද ලංකාවේ කාපිරි වාසය කොට ඇත. පළමු හා දෙවන ලෝක යුද සමයේ සුදු ජාතිකයින් සමග සේනාංකවල කාපිරි ජාතිකයින් ලංකාව වෙනුවෙන් යුද වැදී ඇත. රොබට් නොක්ස් ගේ වාර්තාවට අනුව දෙවන රාජසිංහ රජුටද කාපිරි සේනාංකයක් තිබී ඇත. ශ්‍රී වික්‍රම රජු යටතේ ඔහු ගේ සේනාංකවල දෙසීයක පමණ කාපිරි හමුදාවක් සිටි බව ජෝන් ඩොයිලි ගේ වාර්තා වල සඳහන් වෙයි.

වහලුන් පදිංචිව සිටි මෙම වහල් දූපත යන නමට එරෙහිව විසිවන සියවසේ ලංකාවේ පුවත්පත් වලින් විශාල ප්‍රචාරයක් ගෙන ගොස් ඇත. මෙය දූපත කීවත් දූපතක් වශයෙන් අද කොහෙත්ම දැක ගත නොහැකි. පැරැණි තොරතුරු වලට අනුවද මෙය දූපතක් නොවන බවටද ඉතිහාසඥයන් දක්වති. ලන්දේසි ජාතික නගර නිර්මාණකරුවෙකු වූ මිනින්දෝරු ඒඩ්‍රියන් ද ලීව් 1796 කොළඹ නගරය සැලසුම් කළ වාර්තාවල ද ඒ බවක් දක්වා ඇත.


කෙසේ වෙතත් සියවස් ගණනාවක් තිස්සේ බේරේ වැව පෘතුග්‍රීසි ලන්දේසි හා ඉංග්‍රීසි ජාතීන්ගේ ඉමහත් පැසසුමට හා වර්ණාවට භාජනය වූවකි. අද ද එය කොළඹ නගරයට ගෙන දෙන්නේ මනස්කාන්ත දර්ශනයකි.



1905 දී කොම්පඤ්ඤ වීදිය



# "බාලගිරි දෝෂය අද නොවේ හෙටයි"



## කවුද? මේ බාලගිරි

අගක් මුලක් නොදැන ගත්තත් බාලගිරි ගැන අසා නැති අයෙකු නැති තරම්ය. අදද ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ වල කුඩා බිළිඳුන් සිටින නිවෙස් වල නිවසේ ප්‍රධාන උළුවස්ස උඩ " බාලගිරි දෝෂය අද නොවේ හෙට" යනුවෙන් ලියා තිබෙනු දැක ගන්නට ලැබෙයි.

මෙය කොහෙන් කුමක් නිසා පැන නැගුනක් ද යන්න දන්න අය ඇත්නම් ඒ ස්වල්ප දෙනෙකි. මේ ගිරිදේවියගේ එක් වේෂයකි. ගිරි දේවිය කවුද?

දඹදිව දන්ත පුරයේ සිංහ කුමරුගේ හා හංසවතී දේවියගේ දියණිය ගිරි දේවිය වූවාය. මෙම දෙපළට පළමුව උපත ලැබුවේ පුතෙකි. ඒ දළ කුමරුයි. දෙවනුව දියණියක උපන්නාය. ඇය උපත ලබා සත් දිනයකින් පුරෝහිත බමුණන් ගෙන්වා නිමිති පාඨ ඇසූහ. නිමිති පාඨ කියූ සියල්ලන්ගෙ ම අදහස වූයේ ඇය වැඩිවියට පත්වූ පසු සිය වැඩිමල් සහෝදරයා සමග සංවාසයේ යෙදෙන බවයි. මෙම ප්‍රකාශයෙන් මා පියෝ මහත් කැලබිල්ලට පත්වූහ. ශිෂ්ට සම්පන්න දෙමාපියන්ගේ දූ දරුවන් සහෝදර සහෝදරියන් සමග එසේ සංවාසයේ යෙදීමක් සිදුවන්නේ නැත.

මෙයින් විස්තෝපයට පත් මාපියන් කලේ ගිරි දේවිය ගල්ගුහාවක සිරකර තබා පෝෂණය කිරීමයි. කිසිම විටක සිය වැඩිමහල් සහෝදරයාගේ ඇස ගැටීමට ඉඩ නොතැබූහ.

මෙම ගල් ගුහාව තුළ ගිරි දේවිය ඉතා හොඳින් වැඩුනාය. රූපශ්‍රීයෙන් අග තැන්පත් මනා රූ සපුවෙන් යුත් ඇය දුටුවන් ප්‍රමෝදයට පත් කරන රූප ලාලිත්‍යයක් ඇයට හිමි විය.

කාලයත් සමග දළ කුමරුට දැන ගන්නට ලැබුනේ තමාට නැගනියක් සිටින බවත් ඇය ගල් ගුහාවක සගවා පෝෂණය කරන බවත්ය. මෙය දැන ගත් දළ කුමරු ඇය දැකීමේ නොතිත් ආශාවෙන් නිතර නිතර දෙමාපියන්ට කරදර කිරීමට පටන් ගත්තේය. එහෙත් පළක් නොවුන තැන දළ කුමරු කියා සිටියේ එසේ නොකළ හොත් සිය දිවි නසා ගන්නා බවයි.

ඔහුගේ බල කිරීම හා තර්ජනය ඉදිරියේ අසරණ වූ සිංහ කුමරු හා හංසවතී අවසානයේ දළ කුමරුට සිය දියණිය වූ ඔහුගේ නැගනිය ගිරි දේවිය පෙන්වීමට තීන්දු කළහ. ඒ අනුව දිනක් දළ කුමරුට ගිරි දේවිය සිටින ගල්ලෙනට ඇතුළු වීමට



අවසර ලැබුණි. ඒ අවසරය ලබා ගල්ලෙනට පිවිස දළ කුමරුට තම නැගනිය දැක ගැනීමට හැකි විය.

ඇය තුළින් දිස් වූ මන මෝහනීය රූප ශ්‍රීයෙන් උන්මාදයට පත්වූ දළ කුමරු කෙසේ හෝ ඇය තම සිතැගියාවන්ට පොළඹවාගන ඇය හා යහන්ගත විය.

**රන් දම් සේ අත් දෙක අල්වාගෙන**
**කැන්දාගෙන ගොස් යහනේ ඉන්දාගෙන**
**මන් දැන් විඳි දුක් නුඹම සිතාගන**
**රන් තලි මද යුද හැසුරුනු කැන්දන**

මුසපත් වූ කාමාවේග යන් සමහන් වූ පසු තමන් සිය හැඟීම් සන්තර්පනය කරගත්තේ තම සහෝදරයා මතින් නොවේදෝයි මහත් සිත් තැවුලට පත්වූ ගිරි දේවිය ගෙල වැලලාගන සිය ජීවිතය නසා ගත්තීය.

**එමට රුවිනි බිසවුන් වෙන නැතිවද**
**මෙමට ආලෙ නුඹ කුමකට සිතුවද**
**නමට උතුම් රජ වලිය නොවේවද**
**මෙමට කරපු දේ කිළුටක් නම් වෙද**

ගිරි දේවිය සියදිවි නසාගත් බව දළ කුමරු දැන ගන්නේ පසුය. ඔහු ඇගේ සිරුර සොයා ඇවිද්දේය. මේ සිදුවීම දකින සක්‍ර දේවේන්ද්‍රයා ගිරි දේවියගේ සිරුර සඟවන්නේය. ගිරි දේවියගේ සිරුර දැක ගැනීමට නොහැකිව දළ කුමරු මහත් ක්‍රෝධයට පත්ව සක්වල පුරා ඇවිද ගියේ මහත් විනාශයක් සිදුකරමිනි.

**සතර මෙසක්වල වටවිම සාපී**
**සතර එදිවයින ඇවිද බලාපී**
**විතර මහත් කඳුහෙල් පෙරලාපී**
**නිතර ගජන් බිම ගසා මරාපී.**

දළ කුමරුගෙන් ලෝකයට ජනතාවට සත්වයින්ට සිදුවන විනාශය දුටු සක්‍රයා ගිරි දේවියගේ සිරුර දළ කුමරුට පෙන්වීමට සලස්වා ඇයට නැවත පණ පිහිටුවා සක්‍ර භවනට රැගෙන ගිය බව කියවේ.

**ඔසරි පොටෙන් ඇඟ ගත පිරිමැදලා**
**තිසරු ලෙසින් පියයුරු දෙක දැකලා**
**වියරු මතින් වත සිඹ සනසාලා**
**කියති ඉතින් දෙස් පන පිහිටාලා**

ගිරි දේවියගේ නිසල රුව දකින දළ කුමරු මහත් කම්පනයට පත්ව ඔහුද සිය දිවි නසා ගත්තේය. ඉන් අනතුරුව යක්ෂයෙකු බවට උපදින්නේය.

දළ කුමරු වරෙක දෙවියෙකු ද වරෙක යක්ෂයෙකු ලෙස ද පෙනී සිටිත් එසේම ගිරි දේවියද වරෙක දිව්‍යාංගනාවක් ලෙසත් තවත් වරෙක යක්ෂණියක් ලෙසත් පෙනී සිටින්නීය.

ගරා යකා යනුවෙන් මිනිස් වහරේ එන්නේ මේ දළ කුමරුගේ යක්ෂ අවතාරයයි. කැත කුණු කිලි ඉවත් කිරීමේ බලයක් ගරා යක්ෂයාට ඇතැයි විශ්වාස කෙරේ. ගරා යකාට හෝ ගිරි දේවියට ලංකාවේ දේවාල ඉදිවී නැතත් බලි තොවිල් ගම්මඩු ආදියේ අවසානයේ ගරා යකා පුද කිරීම සිදුකරයි. එසේ කරන්නේ කිළි කුණු දොස් හැරීමට ඔහුට පුලුවන්




යන මතය අනුවය. අලුතින් සැදෙන නිවෙස් ඉදිරිපිට යක්ෂයෙක් හෝ යක්ෂ මුහුණක් ප්‍රදර්ශනය කරන්නේද මේ ගරා යක් මූණයි.

ගරා යකා හා ගිරි දේවිය පිළිබඳව ජනප්‍රවාදයේ කියවෙන පරිදි අවතාර 12 ක් ගැන කියයි. **මදන ගිරි, හපුමල් ගිරි, බාල ගිරි, මෝලන් ගිරි, භූත ගිරි, නීල ගිරි, රතන ගිරි, හඳුන් ගිරි, පට්ටි ගිරි, කොට ගිරි සහ අඳුන් ගිරි** මේ අනුව ගිරි ළියන් 12 ක් ගැන කියවේ. මේ එකම ගිරි විවිධ අවස්ථාවල එළෙස අවතාර වශයෙන් පෙනී සිටී.

දළ යකුන්ද දොළසක් ගැන කියවේ. **අඳුන් ගරා, සොහොන් ගරා, දේස ගරා, සඳුන් ගරා, පුෂ්ප ගරා, කණ ගරා, අමා ගරා, ලවුනා ගරා, වාත ගරා, තොටය ගරා** ආදී වශයෙනි. මේ එක් එක් ගරා වෙනුවෙන් ගිරි දේවියක්ද සිටියි.

අනුරාධපුර පොළොන්නරුව ත්‍රිකුණාමලය ආදී ප්‍රදේශවල මේ ගිරි හා දළ වෙනුවෙන් විවිධ පූජෝපහාර පවත්වයි. දළ කුමරුගේ හා ගිරිදේවියගේ නිරුවත් බලි සදා බලි පූජා පවත්වයි.

තවද ඉඩෝරය පහව යාම සඳහා මෙම බලි පූජා පැවැත්වීම සිදුකරයි. නිරුවත් බලි සාදා දෝලාවක තබා වැව් පිටියට ගෙන ගොස් අවශ්‍ය පූජෝපහාර පවත්වා පලි එහි දමා ඇදුරෝ හා පිරිස ආපසු එති.

**නගේ මන්ද නුඹ එහෙම සිතුවේ**
**ද ගේ කියා මම නුඹ ගෙන්නුයේ**
**මගේ මදන වෙරි නුඹ පහ කෙරුවේ**
**මගේ රුවට රුව නුඹට ගෙනාවේ**

**දයි කුසයට මගෙ ගිනි ඇවිලෙන්නේ**
**වෙයි මොකවත් මේ දුක නොතිබෙන්නේ**
**දෙයියන්ටත් මගෙ දිවි නොපෙනෙන්නේ**
**අයියට කල්බැද කොහොමද ඉන්නේ**

**බැන්ද වරලස පීරා කොනකට**
**බින්දා පියයුරු කැකුලු ලැමැද පිට**
**කැන්දා කල්බැද නගා සරණ කොට**
**නින්දා පවසති වද අප දෙන්නට**

**තබා සිරි රස යහනේම තබාපු**
**විඩාවයෙන් ගිරි ලද එළි බැසපූ**
**අඩා ඇසල කරු මුදුනට නැගපූ**
**නොබා සිතින් බොටුවේ වැල ලාපූ**

ගරා යකු හා ගිරි දේවිය උදෙසා කරන බලි පූජාවලදී මෙවැනි කවි ඇදුරන් විසින් ගායනා කරනු අසන්නට ලැබෙයි.

# මගේ ජීවය එළිය වේවිද?

සඳ වැසී තරු ගිලී - ලෝකයම අඳුරු වී
එළියක් නොමැත - ඉන්නවා මාවතේ අඳුරු
මොනවද කරන්නේ - යන්නේ කොහෙ කියා
මම ඉන්නවා දස අතේ සිත සිතා...

නිතරම දැවෙයි හදවත ගිණි ගොඩක් වගේ
පාලුව තනිය මා වට කර බැඳෙනවනේ
මේ ඇයි කියා මා පිළිතුරු සොයනවනේ
විසඳුම කොහෙද? කාලය දැයි මට නොසිතේ

ගී පද තනන්නට තාලෙට ගයන්නට
පැතුම් පිරුව හදවත නෑ දකින්නට
නමුත් දෛවය කරන සරදම
දිනක නැතිවේ ලැබෙයි සැනසුම

පෑ වූ අහසේ පුංචි තරුවෙන්
මගෙ ලෝකය එළිය වේවිද
රඳවලා සැනසුම සතුට මගෙ හදේ
මගේ ජීවය එළිය වේවිද?

එළිය වුවත් එළිය නූවත්
කරන්නට තව දෙයක් නෑ මට
මගේ ලෝකය සොයා යමි මම
වෙන දෙයක් නෑ ඉතිරි වී අද

**එස්.පී. ද සිල්වා - කැනඩාව**

# දම්මි - සුගත්

දුන්නොත් යුරෝ කෙනෙකුට
ගන්නෙ සිනාව පුරවාගෙන මුහුනට
ඉල්ලු නිසා හදිස්සියකට අමාරුවකට
දෙන්නේ උදව්වට මිනිස්කමට
ගත් පසුව යුරෝ අතට
දම්මි - සුගත් වගෙයි හරියට
කාලය ගෙවෙයි අවුරුද්දට දෙකට
මුදල නොලැබෙයි දුන් කෙනාහට
හිත් වේදනා පිරෙයි මුදල් දීලා
හිතවත්කමට නෑ කමට
ණයක් මුදලත් හරියට
දම්මි - සුගත් වගෙයි
ගොළු හදවතක් වෙලා
කථා නැවතිලා, ටෙලිෆෝන්
නොම්මර මාරු වෙලා
නගරයෙනුත් පැනගොසින්
නිහඬව බව රැකගෙන
ජීවත් වෙයි අපූරුවට

**ප්‍රින්සි රණසිංහ ආරච්චිගේ**
**වෙරෝනා නගරය,**
**ඉතාලිය.**



# ඈ හා බැඳුනෙමි

හසරක් නොදන සිටි කාලය ගෙවී ගිහින්
වස විස කටු කොහොල් හඳුනාගෙන මැ විහින්
බැස කරළියට ජීවිතයේ සිනිඳු සිහින්
රස උල්පතෙක ගිලූනෙමි මම වයස ගිහින්

මව්පිය ආදරය මට එනමුත් ලැබුණා
හව්හරණය පතා මම ඇය වෙත ඇඳුනා
සව්සිරි සැපත නැතිව ද මට සැප තිබුණා
නිවිමට මනස මගෙ ඇය මා ළඟ රැඳුණා

ආලය ආදරය සෙනහස වදන් වැල
ඈ හා බැඳුණ දින සිට එළි කළා පැල
මා ළය විලේ පුබුදා පස් පියුම් පෙළ
කාලය විසින් ලැබ දුනි මට දෙදරු පල

යුගදිවි ඇරඹලා තුන් තිස් වසර අද
සගයා ඇයයි මගෙ මා ළඟ සිටින හොඳ
අග හිඟ තිබෙන මුත් කොතෙකුත් දිවිය මැද
රඟ දෙමු දිවි හවෙ සැප දුක අතර හිඳ

**ගොංගිතොට සරත්**




# වාසනා !

හෙට දින සුන්දරයි

සිත තුළ ජයගන්න
හිත කලකිරී ජීවය
එපා හැරයන්න
රෑ වැටි වළේ
දිවා කාලෙද නොවැටෙන්න
අතීතයේ පාඩම්
සිහියට ගන්න ....

දෛවය නපුරු වී නැහැ
ඔබ හට තාමත්
ඉක්මන් වනු එපා
තීරණ මත ආයෙත්
ඔබ තනි නොවේ
මේ ලොව යළි කවදාවත්
රම්මිත්, කරුත්, ඔබ ළඟමයි
හැමදාමත්....

**ආර්. එම්. කේ. රාජපක්ෂ**








# අපට අහිමි වන අපේ උරුමය

# දැලිවල කොටවෙහෙර පුරාවස්තු සොරකම

"නිදානයක් ගන්න තියෙනවා නම් ඉතිං ගොඩ තමයි" මේ ඉදහිට සමාජයේ යම් යම් පිරිස් අතර කියවෙන කතාවකි. කාලෙන් කාලෙට මේ දනව්වල මිනිසුන් අතර "නිදන් පිස්සුව" ඉස්මතු වන අවස්ථාද අසන්නට දකින්නට ලැබෙයි. මේ කාලෙට මිනිස්සු ගල් ගොඩවල් පස් ගොඩවල්වල පවා යම් යම් සලකුණු ඇද්දැයි සොයා බලමින් නිදන් සොයති.

වැඩිම ප්‍රමාණයක් මෙම නිදන්වල ඇත්තේ බෞද්ධ උරුමයකි. විශේෂයෙන් දාගැබ් බුදුපිළිම හාරා නිදන් සොයති. මෙම වසර 2200 ක් පැරැණි රඹුක්කන දැලිවල කොටවෙහෙර චෛත්‍යයේ තිබූ මිල කළ නොහැකි නිදන් වස්තු සොරා ගැනීමේ පුවත පසුගිය පෙබරවාරි 11 වනදා රටපුරා ප්‍රචාරය වන්නට විය. මෙම පුරා වස්තුවල රන්මය වටිනාකමට යම් මිලක් ඇතත් එහි ඓතිහාසික වටිනාකමට මිලක් කළ නොහැකිය.

රඹුක්කන දැලිවල කොටවෙහෙර යනු කොත රහිත චෛත්‍යය සම්ප්‍රදායේ චෛත්‍යයකි. මෙය දේවානම්පියතිස්ස රජුගේ බාල සොහොයුරෙකු වූ මෙම ප්‍රදේශය පාලනය කලාවූ තිෂ්‍ව කීර්ති යුවරජු විසින් මෙය ඉදිකර ඇති බවට ඉතිහාසයේ දැක්වෙයි.

මහින්දාගමනයත් සමග ඇතිවූ මෙරට බෞද්ධ පුනරුදය හේතුවෙන් රටපුරා බෞද්ධ සිද්ධස්ථාන බිහිවන්නට විය. එකල ජනයා අසීමිත ශ්‍රද්ධාවෙන් යුක්තව මෙම වෙහෙර විහාරස්ථාන ඉදිකරමින් ඒවා වැද පුදා ගනිමින් ඒවා ආරක්ෂා කරගනිමින් රැකබලා ගත්හ.

මෙම දැලිවල කොටවෙහෙර වර්තමානයට ඉතා වැදගත් වූයේ එය කිසිදා නිදන් සොරුන්ට හසුව නොතිබූ චෛත්‍යයක් වීම නිසාය. මෙය කිසිදා කිසිදු ප්‍රතිසංස්කරණයකටද භාජනය වී නොතිබුණි.

1957 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කැනීම් කරන තෙක් දැලිවල කොටවෙහෙර නිදන් සොරකුගේ වත් අවධානයට ලක් නොවී තිබීම අතිශයයෙන්ම පුදුමයට කාරණයකි. එම කැනීම් වලදී සුවිශේෂී නිදන් වස්තු රැසක් හමුවිය.

වර්ෂ 2200 ට පෙර ඉදිවූ පසු නැවත ප්‍රතිසංස්කරණයකට භාජනය නොවූ බැවින් එහි තිබූ පුරාවස්තු දේවානම්පියතිස්ස රජ සමයේ තැන්පත් කළ වස්තූන්ම වීම විශේෂයකි. මෙහි දඹ රනින් නිර්මිතවූ අලංකාර මෙන්ම වටිනාකමින් ඉහළ කරඬු තැන්පත් වී තිබුණි. ඉන්දියාවේ සාංචි ස්තූපයේ හැඩයෙන් යුත් රන්මුවා කරඬුව එකල ස්තූප සම්ප්‍රදාය නිර්මාණය වී තිබුණි. මෙය ලෝකයේ පැරැණිම දාගැබ් ආකෘතිය විය. මෙවැනි කරඬු මෙතෙක් හමුවී ඇත්තේ රුවන්වැලි සෑයෙන් හා මිහින්තලේ මිහිදු මහා සෑයෙන් පමණි.

**මෙහි දඹ රනින් නිර්මිතවූ අලංකාර මෙන්ම වටිනාකමින් ඉහළ කරඬු තැන්පත් වී තිබුණි. ඉන්දියාවේ සාංචි ස්තූපයේ හැඩයෙන් යුත් රන්මුවා කරඬුව එකල ස්තූප සම්ප්‍රදාය නිර්මාණය වී තිබුණි. මෙය ලෝකයේ පැරැණිම දාගැබ් ආකෘතිය විය. මෙවැනි කරඬු මෙතෙක් හමුවී ඇත්තේ රුවන්වැලි සෑයෙන් හා මිහින්තලේ මිහිදු මහා සෑයෙන් පමණි.**

මෙම තුළ තිබූ ධාතු කරඬුව වසා තිබූ රෙදි කැබැල්ල ද ඓතිහාසික වටිනාකමින් අනූනය. එම රෙදි කඩ චෛත්‍යය වෙත ධාතු කරඬුව වැඩමවීමේදී එය වසාගෙන පැමිණි රෙදි කඩයි. රෙදි කඩකින් වසා කරඬුව වැඩම කරවීමේ සම්ප්‍රදාය එදා සිට පැවැත එන්නක් බව එයින් විද්‍යාමාන වෙයි. එම රෙදි කඩ ඕස්ට්‍රේලියාවට ගෙනගොස් කරන ලද කාබන් පරීක්ෂණයේදී වසර 2200 ක් පැරැණි බව විද්‍යාත්මකවද සනාථ විය. එය මෙරට ඉතිහාස ගත තොරතුරු අනුවද එලෙසින්ම තහවුරුවීම මේ රටේ ඉතිහාසය හා ඉතිහාසඥයින් ගේ නිගමන කොයිතරම් දුරට සනාථ වීමක්ද?





එදා මෙම චෛත්‍යයෙන් ගොඩ ගන්නා ලද මෙම පුරාවස්තු තැන්පත් කොට තිබුණේ දැලිවල කොටවෙහෙර පන්සලේය. එය පසු ගියදා අතුරුදහන් වූ අතර මේ ලියන මොහොත දක්වාම ඒ පිළිබඳව කිසිඳු තොරතුරක් මෙතෙක් අනාවරණය වී නොමැත.

කෙසේ නමුත් අපිට කෙතරම් දිගු ඉතිහාසයක් ඇතත් රටපුරා අපමණ පුරාවස්තු ඇතත් ඒවා නිසි ලෙස ආරක්ෂා කරන හෝ සංරක්ෂණය කරන වැඩ පිළිවෙළක් නොමැත. රාජ්‍ය නිලධාරීන්ගේ සිට දේශපාලඥයා දක්වාද චීවරධාරීන්ගේ සිට පොදු ජනයා දක්වාද මෙම නිදන් වස්තු කෙරෙහි දක්වන්නේ පුදුමාකාර ගිජුකමකි. ඒවා අලෙවි කර එය මුදල් කරගැනීම මොවුන්ගේ එකම ආශාවය. පසු ගිය කාලවකවානු තුළ දේශපාලනඥයින් රාජ්‍ය නිලධාරීන් චීවරධාරීන් හා නිදන් සොරකම අතර නොයෙකුත් කතා පැතිරී තිබුණි එය අද ද එසේමය.

මෙවන් සමාජයක් තුළ රටක ඓතිහාසික හෝ ජාතික උරුමයක් රැකගැනීම පහසු කාර්යක් නොවේ. කොළඹ ජාතික කෞතුකාගාරය තුළ තිබූ කෞතුක භාණ්ඩ පවා සොරුන් අතට පත්වූ රටක් වන අප රට තුළ හුදකලාව දාගැබ් තුළ හෝ පන්සල් තුළ හෝ වනාන්තර තුළ ඇති කෞතුක භාණ්ඩ ගැන කවර කතා ද?

මේවා සොරා ගන්නා සොරුන්ට දෙස් දොවොල් තබමින් සැපකරනවා හැර සාමාන්‍ය ජනයාට කළ හැකි දෙයක් නොමැත. කෙසේ නමුත් මෙමෙ අපරාධකරුවන්ට ස්වභාව ධර්මයෙන් දඬුවම් ලැබීඹ සාමාන්‍ය දෙයකි. එය එසේ වුවත් අනාගත පරපුරට එම වස්තූන් අහිමි වීම ඛේදජනක තත්ත්වයකි.

මෙවැනි දේ රැක ගැනීමට පොදුජනයාද යම් තරමකින් හෝ මැදිහත් වන්නේ නම් ඉතිරිව ඇති ටික හරි තව ටික කාලයක් රැක ගත හැකිය.




# ආකර්ශණීය මුදලකට ගුවන් ටිකට්පත් මිලදී ගත හැක.

ඩුබායි කටාර් කුවේට් ඔමාන්
සවුදි ලන්ඩන් පැරිස් කැනඩා
ඕස්ට්‍රේලියා මාලදිවයින ඉතාලි ජපානය

## ඇතුළු ලොව ඕනෑම රටකට ගමන් කිරීම සඳහා...

## වැඩි විස්තර සඳහා අමතන්න...


**සීමිත සිලොන් ෂිපිං ලයින්ස් සමාගම,**
**450, ඩී. ආර්. විජේවර්ධන මාවත,**
**කොළඹ 10.**
**දුරකථන : 011-2689500-8**


M - 077-2672970
077-3572835
077-3561210
E - csltravels@sltnet.lk

CSL TRAVELS

IATA ACCREDITED AGENT

ස යු රේ න් එතෙර






# මානව හිතවාදියෙකුගේ නික්ම යෑම

## සුනිල්

### මාධව ප්‍රේමතිලක



මෙරට පුවත්පත් කලාව තුළ දැවැන්ත පෞරුෂයක් ගොඩ නගාගත් මාධ්‍යවේදීන් අතර සුනිල් මාධව ප්‍රේමතිලකයන්ට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. ඔහුට සිය මාධ්‍ය සගයින් හෝ වේවා පාඨක සහෘදයින් හෝ වේවා වයස ස්ත්‍රී පුරුෂ ලොකු කුඩා කුල මල කිසිවක් නැතිව සැමට එක වගේ ආදරය කළ හැකි මිත්‍ර විය හැකි අවංක ගුණයක් තිබිණි. ඔහුගේ ලේඛණ ශෛලිය හැමවිටම තාරුණ්‍යයට ආමන්ත්‍රණය කළත් සෑම වයසකම ස්ත්‍රී පුරුෂ විශාල පාඨක සංඛ්‍යාවක් සිටියහ.

විද්‍යුත් මාධ්‍ය පෙරට ඒමට පෙර මුද්‍රිත මාධ්‍ය අද මෙන් නොව එදා බොහෝ ජනප්‍රිය යුගයක් විය. ඈත පිටිසර ගම් දනව් වල විශාල වශයෙන් පුවත් පත් කියවන පාඨකයින් සිටියහ. ඒ සෑම අයෙකුම සුනිල් මාධවගේ ලිපි කවි කියවීමට ප්‍රියතාවක් දැක්වීය. ඔහුගේ ජනප්‍රියතාව නිසාම ඒ වෙනුවෙන්ම පුවත්පත් මිලදී ගන්නා පාඨක පිරිසක්ද සිටියහ. මොවුන්ගෙන් අතිමහත් බහුතරය සුනිල් මාධව තියා ඔහුගේ ජායාරූපයක් වත් දැක තිබුණේ නැත. එහෙත් ඒ පාඨකයින් ඔහුට දැඩිව ආදරය කළහ.

ඔහුගේ ලේඛණ ශෛලිය තුළින් ඒ පාඨකයින්ගේ ආදරයට ගෞරවණීය ලෙස ආමන්ත්‍රණය කිරීමේ ගුණයක් කැටි වී තිබුණි. ලෝක ප්‍රකට විද්වතුන්ගේ දර්ශනයත්, මාක්ස්වාදය, දේශපාලන චින්තන දහරාවන් මනාව කියවා ලබාගත් දැනුමෙහි සාරය පාඨකයාට සරල එහෙත් ගැඹුරු ලෙස කාවැද්දීමට සමත් විය. ඔහු ගැන කිසිවක් නොදත් සෑම පාඨකයෙකුම හැම විටම සිතා සිටියේ මැදිවිය නොයික්ම වූ ලේඛක සහෘදයෙකු වශයෙනි.

මෙරට ප්‍රකට කවියෙකු මෙන්ම සිළුමිණ පුවත්පතේ කතෘවරයෙකු ද වූ මීමන ප්‍රේමතිලකයන්ගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රයා වූයේ සුනිල් මාධවයි. පිය ආභාෂය නිසාම වයස 16 දී පමණ ලේක් හවුස් ආයතනයට පැමිණ සිළුමිණ කතෘ මණ්ඩලයේ වැඩ කර මෙරට ප්‍රවීන ජනමාධ්‍යවේදීන්ගේ ඇසුර ලැබූ සුනිල් සිය මාධ්‍ය සගයින් අතර 'සුනිල් අයියා' ලෙස ගෞරවාදරයට පත්විය. අනතුරුව ලේක් හවුස් ආයතනයෙන් දිවයින පුවත්පත ආරම්භයේදීම ආරම්භක කතෘ මණ්ඩලයට එක් වූ අයෙකි.

සත්‍යවාදියෙකුගේ දිනපොත නම් ඔහුගේ ලියූ විශේෂාංගය ලොකු කුඩා කාගේත් සිත් ඇද බැද ගත්තේය. යුද්ධය විප්ලවය සමාජ විෂමතාව සාමය දේශපාලනය මානව ගුණ ධර්ම මේ සියල්ල ඒ තුළ කැටි වී තිබුණි.

අසූව දශකයේ පැවැති භීෂණය හා මර්ධනකාරී රාජ්‍ය පාලනයට අභියෝග කළ සුනිල් මාධව කිසි විටක රාජ්‍ය ත්‍රස්තවාදයට බිය වූයේ නැත. මර්ධනය එන්න එන්නම දැඩි වන විට ඔහු එයට තව තවත් අභියෝග කරමින් කිට්ටු විය. සතුරාට කිට්ටු වීම හැර සැඟවීම විකල්පය නොවන බව ඔහුගේ මතයයි. එකල පැවති රාජ්‍ය ත්‍රස්තවාදය එළිපිට මුහුණ දෙමින් මිනිසුන් අතරම සිටි ප්‍රබල මාධ්‍යවේදියා ඔහු විය.

එම භීෂණයත් සමග විකල්ප පුවත්පත් රැසක් බිහිවන්ට විය. ජාතික පුවත්පත් වලින් විකල්ප පුවත්පත් වලට ගිය සුනිල් මාධව එම භිෂණයට අභියෝග කළේය. කිසි විටක මුදලට වරදාන වලට යට නොවුණු මාධ්‍යවේදියෙකි. විවේචනයේදී ඔහුට පුද්ගලයා හෝ තරාතිරම අදාළ වූයේ නැත. ඔහුට බොහෝ දෙනා ආදරය කළ නමුදු ඔහු පුද්ගලයින් තෝරාගෙන වෙන වෙනම ආදරය කළේ නැත. ඔහු සැමට එකසේ ආදරය කළේය. බස් පොලේ මහපාරේ වැඩපලේ මුඩුක්කුවේ පවා පිරිස් ඔහුට ආදරය කළේය. සමාජයේ උසස් තානාන්තර වල සිටි බොහෝ ප්‍රසිද්ධ යමක් කමක් කළ හැකි. නොයෙක් දෙනා ඔහු දැන හැඳින සිටියහ. එහෙත් කිසිවිට ඔවුන් ලඟ සිය ආත්මය පාවාදී වරප්‍රසාද ගත්තේ නැත. අතේ මුදල් තිබෙන වේලාවක් නැති තරම්ය. ඔහු අතට එන මුදල අවසන් වීමට ගතවන්නේ නිමේශයකි. අසරණයෙකු දුටු විට සිය සම්පූර්ණ පඩි පත පවා ඔහු වෙනුවෙන් වැය කිරීමට ඔහු සූදානම්ය.

**ඔහුගේ ලේඛණ ශෛලිය තුළින් ඒ පාඨකයින්ගේ ආදරයට ගෞරවණීය ලෙස ආමන්ත්‍රණය කිරීමේ ගුණයක් කැටි වී තිබුණි. ලෝක ප්‍රකට විද්වතුන්ගේ දර්ශනයත්, මාක්ස්වාදය, දේශපාලන චින්තන දහරාවන් මනාව කියවා ලබාගත් දැනුමෙහි සාරය පාඨකයාට සරල එහෙත් ගැඹුරු ලෙස කාවැද්දීමට සමත් විය.**

මාක්ස්වාදී දේශපාලනයට ඇලුම්කළ ඔහු පංති බේදය කුල බේදය ඇති නැති පතරය ප්‍රතික්ෂේප කළ සමාජ සාධාරණත්වය වෙනුවෙන් සිය පැන මෙහෙයැවීය.

කෙසේ නමුත් මෙරට තුළ සුනිල් මාධව අතහැර මුද්‍රිත මාධ්‍ය ඉතිහාසයක් විය නොහැක. ඔහු ඒ තරමටම මාධ්‍ය තුළ හා පාඨක හදවත් තුළ කිදා බැස ගත් චරිතයකි. සුනිල් කිසිදා වියපත් වූ අයෙකු ද නොවේ. ඔහුගේ භාෂා ශෛලියේ හැමදාම පැවති යෞවනත්වයෙන් පිරී විප්ලවකාරී ලේඛන කෞෂල්‍යය හැමදාම තිබුණි. ඔහුගේ ලේඛණ කියවන හැමටම නිරන්තරයෙන් සිතට වැටෙන්නේ මොහු අවුරුදු විසිපහක තිහක තරුණයෙකු නොවේද යන්නය. තරුණයෙකු තුළ ඇති අති ධාවනකාරී ජවයකත් බහුශ්‍රැත වියපත් උගතෙකු තුළ පවතින හරවත් බවත් මානව හිතවාදියෙකු තුල පවතින හිතෛශීවන්ත බවත් සාහිත්‍යවේදියෙකු තුළ ඇති ශෘංගාරාත්මක රසාස්වාදයත් හැමවිටම එකට කැටිවුන ලේඛණ රටාවක් ඔහු තුළින් මතුවීම නිසාම සෑම වයස් මට්ටමකත් නැණ නුවණ අඩු වැඩි කාටත් ඔහුගේ ලේඛණ රසවිඳීමේ හා ඔහුට ළංවීමේ හැකියාව තිබුණි. හැත්තෑව දශකයෙන් පසු මෙරට පුවත්පත් පාඨකයින් අතර සුනිල් මාධව ගැන නොදන්නා අයෙකු සිටිය නොහැකි තරම්ය. ඔහු හැමවිටම ප්‍රකාශ කළේ මරණය සුන්දරයි යන්නය. භිෂණ යුගයේ ඔහුගේ තේමා පාඨය එය විය. අද ඔහු නික්ම ගොසිනි. හිතාදර සුනිල් ඔබට අජරාමර නිවන් සුව ප්‍රාර්ථනා කරමි.

# සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම
## சிலோன் ஷிப்பிங் லைன்ஸ் லிமிட்டட்
# Ceylon Shipping Lines Ltd

**ඔබේ භාණ්ඩ මව් රට ගෙන ඒමට ලොව පුරා සිටින අපගේ නියෝජිත මහතුන් හමුවන්න.**

### ඕස්ට්‍රේලියාව/அவுஸ்திரேலியா/Australia

සී. එස්. එල්. ඕස්ට්‍රේලියා
சி. எஸ். எல். அவுஸ்திரேலியா
**C. S. L. Australia**
10/2, Dingley Ave Dandenong,
Victoria 3175, Australia.
✆ +61397929877/0061 396023966
Fax: +61397924655
✉ cargo@skyway.com.au/www.skyway.com.av

### ජපානය / ஜப்பான் / Japan

ජූරියා ඉන්ටර්නැෂනල්
ஜுரியா இன்டர்நெஷனல்
**Juria International**
✆ +81283205383
Fax: +81283205384
Mobile - 0081-(90) 31027600
✉ tea@cronos.ocn.ne.jp
tcperera@ymail.com / csl@juriaweb.com

සර්ෆායර් ඉන්ටර්නැෂනල්
ஷபீர் இன்டர்நெஷனல்
**Sapphire Int.**
Sakae Cho 1 - 15 - 29
Higashimurayanna City, Tokyo - Japan.
✆ 042 - 936 - 6517

### සිංගප්පූරුව / சிங்கப்புர் / Singapore

එම් ඇන්ඩ් එස් එක්ස්ප්‍රස් කාර්ගෝ ලොජිස්ටික්ස්
எம் என்ட் எஸ் எக்ஸ்பிரஸ் கார்கோ லொஜிஸ்டிக் (பிரை)லிமிட்ட.
**M & S Express Cargo Logistics Pte. Ltd.**
No. 23, Daihousie Lane, Singapore - 209688
✆ +6563966614 / +6563966615
Fax: +6563966621
✉ sales@ms5.com.sg / mifras@ms5.com.sg

### දෝහා - කටාර් / தோஹா - கட்டார் Doha - Qatar

ලාන්ස් ග්ලෝබල් ලොජිස්ටික්ස්
லான்ஸ் க்ளோபல் லொஜிஸ்டிக்ஸ்
**Lans Global Logistics**
PO Box - 31534, Al - Corniche Tower
Doha - Qatar.
✆ +974 40 414141
Fax: +974 40 414199
Mobile +974 40 414141 / 077 3601554
✉ cmb@lanslogistics.com

ගල්ෆ් පැල්කන් සර්විසස් කම්පනි (W.L.L.)
கல்வ் வெல்கன் செர்வீசஸ் கம்பனி
**Gulf Falcon Services Company (W.L.L.)**
PO Box - 7079, Doha - Qatar.
✆ +974 44869723
Fax: +974 77885503 / +974 77883866
✉ gulffalconcargoqatar@gmail.com

ටයිටැනික් වේස් කොමර්ෂියල් සර්විස්
**Titanic Ways Commercial Service**
8279 King Fahad Road, Al Faiha District
P.O. Box : 9184
Jeddah 22241 - 2158 - Kingdom of
Saudi Arabia
✆ +966126447050 Fax: +966 126447050
Mobile: +966556258377 / +94 777901274
✉ mkt@titanicways.com

### මැලේසියාව / மலேசியா / Malaysia

ජයලංකා / ஜயலங்கா
**Jayalanka (M) SDN BHD**
No. 32 - 2 Jalan
14/48 A, Sentul Raya 51000
Kualalampur, Malaysia
✆ 603-40421896 / +966 539222031
00966 532480407
✉ jay_langka@yahoo.com
jayalankacargo@gmail.com

### කුවේට් / குவைத் / Kuwait

ෆැල්කන් කාගෝ / பெல்கன் கார்கோ
**Falcon Cargo**
2952, Safat 13154, Kuwait
✆ 0096522419095, 0096522457315
Fax: 0096522419098
✉ falconcargo@hotmail.com
falcon_cargo@hotmail.com

යුනයිටඩ් එක්ස්ප්‍රස් ලොජිස්ටික්
யுனைட்டட் எக்ஸ்பிரஸ் லொஜிஸ்டிக்
**United Express Logistic**
Office No 26, Qasariya Blg - 2,
Fahaheel, Kuwait
✆ +9652495858/+9652470862/+96522495898
✉ info@unitedexpresslogistics.com

### ඩුබායි යූ ඒ ඊ / டுபாய் யு. ஏ. ஈ. / Dubai U A E

එම්බසි ෂිපිං ඇන්ඩ් ෆ්‍රේට් එල් එල් සී
எம்பசி ஷிப்பிங் என்ட் பிரைட் எல். எல். சீ
**Embassy Shipping & Frieght LLC**
P.O. Box. 32863, Al Aweer, Dubai, UAE.
✆ Toll Free - 800 37 30
Hot Line - 055 244 99 66
Tel: +971 4 320 70 70
Fax: +971 4 320 71 71
✉ info@embassyshipping.com
www.embassyshipping.com

නිර්මාන කාගෝ ඇන්ඩ් ලොජිස්ටික් සර්විස් /
நிர்மான கார்கோ / **Nirmana Cargo and Logistic Service**
PO Box 87556, Dubai, U.A.E.
✆ +971 556000826

හිරු කාගෝ / இரு கார்கோ / **Hiru Cargo**
PO Box 15946,
Dubai
✆ +971 42895750
✉ hirumooncargo@gmail.com

ඕෂන් ලංකා කාගෝ
ஓசியன் லங்கா கார்கோ
**Ocean Lanka Cargo**
P.O. Box - 48843,
Dubai - UAE
✆ 00971-04-2640054
Mobile - 00971-0555 491 987
✉ oceanlankacargolk@gmail.com

ලක්බිම කාගෝ / லக்பிம கார்கோ
**Lakbima Cargo**
P.O. Box - 22675,
Ajman, UAE.
✆ +971 6 7480522
✉ lakbimacargo@gmail.com

### බහරේන් / பஹறைன் / Bahrain

කලම්බු කාගෝ කම්පැනි
கொழும்பு கார்கோ கொம்பனி
**Colombo Cargo Company**
Bahrain
Block 321, 338, Building No 177
Manama / Alaudayiyah,
Kingdom of Bahrain.
✆ +973 35939343
Fax: +973 17 811707
✉ colombosuppliersbhn@gmail.com

### සවුදි අරාබිය / சவுதி அரேபியா Saudi Arabia

#### Jeddah

වර්ල්ඩ් වයිඩ් ෆ්‍රේට් / வேல்ட் வைட் பிரைட்
**World Wide Freight**
World Wide Link,
(A Div. Of Khalid Nazer Ahames Al
Gahathani Trading Est) Jeddah, K.S.A.
✆ 0505657412/0500773931/0543902880
+96626350650/+96626476087/026350650
✉ imthiyaz85360@yahoo.ca

#### දමාම් / Dammam / தமாம்

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
**ABT Cargo Services**
✆ +966550952031

#### රියාද් - ரியாத் - Riyadh

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
**ABT Cargo Services**
Riyadh Office: +966 112700055
✆ +966555892754
+966532083640
✉ abtcargo2016@gmail.com

ෆේම් කාගෝ / பேம் கார்கோ / **Fame Cargo**
P.O. Box 17958, Riyadh 11494
✆ 2442032/4793845/0508273719
Fax: 4793845 / 00966 - 583090555
✉ fameruhcmb@gmail.com

ජී එම් අයි ඉන්ටර්නැෂනල් ප්‍රයිවෙට් ලිමිටඩ්
**G M I International Pvt Ltd.**
German
Mobile: +94 777150997
✆ +94 112890099
Fax: +94 112890099
✉ indika@gmi.lk

### ස්විට්සර්ලන්තය / சுவிட்சர்லாந்து Switzerland

එම් සී එස් කාගෝ / எம் சீ எஸ் கார்கோ
**M C S Cargo**
M.T. & T Gmbh, Sperietweg 1, 8052
Zurich, Switzerland.
✆ 0041-796656563 / 0041- 443025838
✉ mcscargo@swissmail.com

### කැනඩාව / கனடா / Canada

සීකැන් ට්‍රාන්ස්කොන්ටිනන්ටල්
சீகேன் ட்ரான்ஸ்கொன்டினன்டல்
**Ceycan Transcontinental**
1981, Boylen Road,
Unit # 5, Mississawga, Ontairo,
L5slR9
✆ +9056739873
Fax: +9056739905
✉ cslcanada2001@gmail.com
ceycantrans@gmail.com

### එංගලන්තය / இங்கிலாந்து United Kingdom

ජේ පී එන් ෂිපිං / ஜே பி என் சிபிங்
**JPN Shipping**
Unit A2c, Redlands
Coulsdon cR5 2HT wk
✆ 02086680252
✉ info@jpnshippingltd.co.uk

මාස් ග්ලෝබල් ෂිපිං
மாஸ் குளோபல் ஷிப்பிங்
**Mass Global Shipping**
✆ 044(0)208 4221232
Fax: 208 8644244
✉ info@masshipping.com

ඊසි ෂිපිං ලිමිටඩ් / ஈஸி ஷிப்பிங் லிமிட்டட்
**Easy Shipping Ltd.**
Unit 15, Liongate Enterprise Park
80, Moden Rd, Mitcham cR4 N4
✆ 02086489092 / 07908787627
Fax: info@easyshippingltd.co.uk
www.easyshippingltd.co.uk

ඇට්ලස් ෂිපිං / அட்லஸ் ஷிப்பிங்
**Atlas Shipping**
430, High Road, Willesden,
London. NW 10 2HA
✆ 02084596633 / 0794743535
✉ ajantha.atlasshipping@gmail.com

### ඇමරිකාව /அமொரிக்கா /America

කලම්බු එක්ස්ප්‍රස් / கொழும்பு எக்ஸ்பிரஸ்
**Colombo Express**
1115, Inman Ave, Suite - 323
Edison NJ - 08820
✆ 1888 232 1952
✉ nishan@colomboexpress.com
www.colomboexpress.com

# Ceylon Shipping Lines Ltd



450, D.R. Wijewardena Mawatha,
P.O. Box 891, Colombo 10, Sri Lanka.
Tel: (011) 2689500-508, 2680311-315
Fax: (011) 2689510, 2674347
E-mail: csl123@sltnet.lk
cslmgmt@sltnet.lk
Web: www.ceylonshippinglines.com
Contact: Neranjan - 0777224617







Ceylon Shipping Lines Ltd.

SLSI SYSTEM CERTIFIED ISO 9001

MGMT. SYS. RvA C 155

PATA Pacific Asia Travel Association

IATA

TAASL

***Serving with Excellence***

- Customs Bonded Warehousing
- Unaccompanied Personal Baggage Clearing & Door to Door Home Delivery Covering Major Cities in Sri Lanka Connecting with Worldwide Destinations
- Managing Processing, Shipping Forwarding & Distribution of Imports & Exports
- Airline Ticketing & Travel Agency
- City Central Container Depot Freight Station & Island wide Transportation
- Printing & Publishing